57 වන කාණ්ඩය
18 වන කලාපය

අඟහරුවාදා
1964 ඔක්තෝබර් 6

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශය [තී. 3809]

සෙනෙට් සභාවෙන් ලත් සන්දේශය [තී. 3810]

පළමුවන වර කියවන ලද කෙටුම්පත් පණත් :

Ceylon Press Bill [Senate] [තී. 3810 සහ තී. 3833]

Public Performances (Amendment) Bill [Senate] [තී. 3810]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 3813]

පිළිගන්වන ලද කෙටුම්පත් පණත :

Control of the Acquisition of Land Bill [තී. 3843]

Co-operative Societies (Amendment) Bill : [තී. 3844]

දෙවන වර සහ, සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදි.

Ceylon Shipping Corporation Bill : [තී. 3874]

දෙවන වර කියවීම—විවාදය කල් තබන ලදි.

කල් තැබීමේ යෝජනාව [තී. 3888]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තී. 3901]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 57
இல. 18

செவ்வாய்க்கிழமை,
6 ஒக்ரோபர், 1964

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

*அதிகாரபூர்வமான அறிக்கை*

*பிரதான உள்ளடக்கம்*

மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி [ப. 3809]
மூதவையிலிருந்து வந்த செய்தி [ப. 3810]
முதன்முறை மதிப்பிடப்பெற்ற மசோதாக்கள் [ப. 3810] :
Ceylon Press Bill [Senate] [ப. 3810,3833]
Public Performances (Amendment) Bill [Senate] [ப. 3810]
வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 3813] :
CONTROL OF THE ACQUISITION OF LAND BILL [ப. 3843]
முதன்முறை மதிப்பிடப்பெற்றது
Co-operative Societies (Amendment) Bill [ப. 3844]
இரண்டாம் மூன்றும் முறை மதிப்பிடப்பெற்று திருத்தப்பெற்றவாறு நிறைவேறியது
Ceylon Shipping Corporation Bill [ப. 3874]
இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பெற்றது
ஒத்திவைப்புப் பிரேரணை [ப. 3888]
வினுக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 3901]

---

Volume 57
No. 18

Tuesday,
6th October, 1964

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

MESSAGE FROM THE GOVERNOR-GENERAL [c. 3809]
MESSAGE FROM THE SENATE [c. 3810]
BILLS READ THE FIRST TIME :
Ceylon Press Bill [Senate] [c. 3810 & c. 3833]
Public Performances (Amendment) Bill [Senate] [c. 3810]
ORAL ANSWERS TO QUESTIONS [c. 3813]
CONTROL OF THE ACQUISITION OF LAND BILL [c. 3843] :
Read the First time
CO-OPERATIVE SOCIETIES (AMENDMENT) BILL [c. 3844] :
Read a Second time and the Third time, and passed as amended
CEYLON SHIPPING CORPORATION BILL [c. 3874] :
Second Reading—Debate adjourned
ADJOURNMENT MOTION [c. 3888]
WRITTEN ANSWERS TO QUESTIONS [c. 3901]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

**1964 ඔක්තෝබර් 6 වන අඟහරුවාදා**

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු හියු ප්‍රනාන්දු] මූලාසනාරූඪ විය.

---

## අග්‍රාණ්ඩුකාර තුමාගෙන් ලත් සන්දේශය

மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி

MESSAGE FROM THE GOVERNOR-GENERAL

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගෙන් ලැබී තිබෙන සන්දේශයක් මා දැන් කියවනව:

" අග්‍රාණ්ඩුකාර කාර්යාලය

රජවාසල,
කොළඹ,
ශ්‍රී ලංකාව,
1964 ඔක්තෝබර් 5.

යොමුව :
අංක සී. 21/1964
මහත්මයාණනි,

1946 යේ ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාවේ 36 (2) වැනි වගන්තිය ප්‍රකාර, පහත සඳහන් ආකාරයට නම් කරන ලද ව්‍යවස්ථා කෙටුම්පතට මහා රාජනීන් වහන්සේගේ ශ්‍රී නාමයෙන් මම අද දින අනුඥාව දුන් බව ගෞරව පූර්වකව ඔබට දන්වමි.

'An Act to amend the Debt Conciliation Ordinance.'

මේ වගට,

ඔබගේ කීකරු සේවක,
අ. ක: ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාර.

නියෝජිත මන්ත්‍රණ සභාවේ ගරු කථානායකතුමා."





## සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලත් සන්දේශය

மூதவையிலிருந்து வந்த செய்தி

MESSAGE FROM THE SENATE

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලැබුණු සන්දේශයක් දැන් ලේකම් විසින් කියවනවා ඇති.

පහත දැක්වෙන සන්දේශය ලේකම් විසින් කියවන ලදි:

"සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය මතු පළවන කෙටුම්පත් පනත් සම්මත කළෙන් ඊට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වය ඔවුහු අපේක්ෂා කරති:

Ceylon Press
Public Performances (Amendment)"

CEYLON PRESS BILL [SENATE]

**ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන (කම්කරු හා නිවාස කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ எம். பீ. டி சொய்சா சிறிவர்தன—தொழில், வீடமைப்பு அமைச்சர்)*

(The Hon. M. P. de Zoysa Siriwardena—Minister of Labour and Housing)

I move the Second Reading tomorrow.

**කථානායකතුමා**

*(சபாநாயகர்)*

(Mr. Speaker)

When ?

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති හා සභානායක)**

*(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

Tomorrow.

PUBLIC PERFORMANCES (AMENDMENT) BILL [SENATE]

**ගරු ද සොයිසා සිරිවර්ධන**

*(கௌரவ டி சொய்சா சிறிவர்தன)*

(The Hon. de Zoysa Siriwardena)

විසින් ඉදිරිපත් කරන ලදී.

කෙටුම්පත් පනත පළමුවන වර කියවන ලදින්, 1964 ඔක්තෝබර් 13 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்*

PAPERS PRESENTED

1963 අංක 6 දරණ ගිනි පෙට්ටි නිෂ්පාදන ව්‍යවසථා පණතේ අංක 9 දරණ වගන්තිය යටතේ වාණිජ හා කර්මාන්ත ඇමති විසින් පනවන ලද නියෝග මාලාවක්.—[ගරු මෛත්‍රීපාල සේනානායක.]

**සභා මේසය මත තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

(1) 1962 ගිවිසුමාවලියෙහි අංක 10—ලංකාණ්ඩුව හා හංගේරියානු මහජන සමූහාණ්ඩුව අතර 1961 සැප්තැම්බර් මස 12 වෙනි දින කොළඹ දී අත්සන් කරන ලද ගෙවීම් ගිවිසුම.

(2) 1962 ගිවිසුමාවලියෙහි අංක 11—ලංකාණ්ඩුව හා හංගේරියානු මහජන සමූහාණ්ඩුව අතර වූ වෙළඳ ගිවිසුමට 1961 සැප්තැම්බර් මස 12 වැනි දින කොළඹ දී අත්සන් කරන ලද අන්තර් ගිවිසුම.—[ගරු ටී. බී. තෙන්නකෝන්.]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

## හංගේරියානු මහජන සමූහාණ්ඩුව හා ලංකාණ්ඩුව අතර වූ වෙළඳ ගිවිසුමේ අන්තර් ගිවිසුම හා ගෙවීම් ගිවිසුම

*ஹங்கேரிய மக்கள் குடியரசு அரசாங்கத்துக்கும் இலங்கை அரசாங்கத்துக்கு மிடையிலான கொடுப்பனவு உடன்படிக்கையும் வர்த்தக உடன்படிக்கைத் தாயேடும்*

PAYMENTS AGREEMENT AND PROTOCOL TO TRADE AGREEMENT BETWEEN THE GOVERNMENTS OF THE HUNGARIAN PEOPLE'S REPUBLIC AND CEYLON

**ගරු ටී. බී. තෙන්නකෝන් (අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ වැඩබලන ඇමති)**

*(கௌரவ ரீ. பி. தென்னகோன்—பதில் உள்நாட்டு, வெளிநாட்டு வியாபார, விநியோக அமைச்சர்)*

(The Hon. T. B. Tennekoon—Acting Minister of Internal and External Trade and Supply)

වෙළඳ ගිවිසුමේ අතිශය අනුග්‍රාහිත ජාතික සැලකිලි කොන්දේසිය පැහැදිලි කිරීම සඳහාත් දෙරට අතර වෙළඳාම, විශේෂයෙන් ලංකාවෙන් රබර්, පොල් තෙල් හා කපාපු පොල්ද හන්ගේරියාවෙන් සීනි, රෙදිපිළි හා කාර්මික ශිල්පීය උපකරණද සම්බන්ධ වෙළඳාම පෘථුල කිරීම සඳහාත් විධිවිධාන මේ අන්තර් ගිවිසුමෙන් සැලසේ. හන්ගේරියානු ආණ්ඩුව විසින් කෙරෙන කාර්මික සහයෝගතාවය ඇතුළුව වඩා පුළුල් වශයෙන් ආර්ථික සහ කාර්මික සහයෝගය සඳහාද ඉන් විධිවිධාන සැලසේ.

ගෙවීම් ගිවිසුමෙන්, ගිවිසුම්කාර පාර්ශ්වයන්ට අන්‍යොන්‍ය වශයෙන් රන් පවුම් 40,000ක් දක්වා වන පොලී රහිත සැලගතු බැර ක්‍රමයක් සඳහාද විධිවිධාන සැලසෙයි. ගෙවීම් ගිවිසුම ඵලදායිව ක්‍රියාවෙහි යෙදීම සඳහා අවශ්‍ය ශෛවෂයික විස්තර දෙරටේ හිම මධ්‍ය බැංකු විසින් සකස් කරගනු ලබන්නේය.

ලංකාව සහ හන්ගේරියානු මහජන සමූහාණ්ඩුව අතර වන සියලුම ගෙවීම් රන් පවුම් මගින් කරනු ලැබේ.

ගිවිසුම, අත්සන් කළ දිනයෙහි සිට ක්‍රියාත්මක විය. ගිවිසුම්කාර දෙපාර්ශ්වයෙන් කවර පාර්ශ්වයක් හෝ ගිවිසුමේ වලංගු කාලය අවසාන වීමට තුන් මාසයකට පෙර ලියවිල්ලකින් දැනුම් නොදුන හොත් සෑම අවස්ථාවකදීම එක් වර්ෂය බැගින් ගිවිසුම ඉබේම දීර්ඝ වනු ඇත.

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்*

PAPERS PRESENTED

(1) 1958 අංක 12 දරණ තේ ආධාර පනතේ 10 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගය.

(2) රබර් නැවත වගා කිරීම පිණිස ආධාර දීමේ පනතේ (347 වැනි අධිකාරය) 8 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති විසින් පනවන ලද නියෝගය.—[ගරු සී. එස්. රත්වත්තෙ.]

**සභා මේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු

## வினாக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

### කෘෂිකර්ම නිලධාරි (ගොවිපල පාලනය හා නිෂ්පාදන), මාතර : පරීක්ෂණ ගමන් සඳහා ගෙවන ලද ගමන් ගාස්තු

### கமத்தொழில் உத்தியோகத்தர் (பண்ணை முகாமையும் உற்பத்தியும்) மாத்தறை : மேற்பார்வை, பிரயாணப் படிகள்

### AGRICULTURAL OFFICER (FARM MANAGEMENT AND PRODUCTION) MATARA: INSPECTIONS, TRAVELLING EXPENSES, &C.

2. සේනපාල සමරසේකර මයා. (අක්මීමන)

(திரு. சேனபால சமரசேக்கர—அக்மீமன)

(Mr. Senapala Samarasekara—Akmeemana)

කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මාතර, කෘෂිකර්ම නිලධාරි (ගොවිපල පාලනය හා නිෂ්පාදන) යටතේ ගොවිපලවල් කීයක් තිබේද? (ආ) ඔහු මසකට කී වරක් මෙම ගොවිපලවල් පරීක්ෂා කරයිද? (ඉ) මෙම පරීක්ෂණ ගමන් සඳහා මෙම නිලධාරියා දෙපාර්තමේන්තු වාහනයක් පාවිච්චි කරන්නේ නම් රජයට මසකට කොපමණ මුදලක් වියදම් වේයිද? (ඊ) මෙම පරීක්ෂණ ගමන් සඳහා මෙම නිලධාරියා ඔහුගේ පුද්ගලික වාහනය පාවිච්චි කරන්නේ නම් රජයට මසකට කොපමණ මුදලක් වියදම් වේයිද? (උ) මෙම ගමන් සඳහා ඔහුගේ පුද්ගලික වාහනය පාවිච්චි කිරීම වෙනුවෙන් ගමන් ගාස්තු වශයෙන් මෙම මුදල් වර්ෂයේ පසුගිය මාස කිපය තුල ඔහුට කොපමණ මුදලක් ගෙවා තිබේද? (ඌ) මෙම නිලධාරියා මෙම ගමන් සඳහා දෙපාර්තමේන්තු වාහන පාවිච්චි නොකොට ඔහුගේ පුද්ගලික රථය වැඩියෙන් පාවිච්චි කර ඇති බව එතුමා දන්නවාද? (එ) මෙම මුදල් නාස්තිය වැළැක්වීමට එතුමා ක්‍රියා කරනවාද?

கமத்தொழில், உணவு, கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) மாத்தறையில் உள்ள கமத்தொழில் உத்தியோகத்தரின் (பண்ணை முகாமையும் உற்பத்தியும்) கட்டுப்பாட்டின்கீழுள்ள பண்ணைகளெத்தனை? (ஆ) ஒரு மாதத்தில் எத்தனை தடவைகள் அவர் இப்பண்ணைகளைப் பார்வையிடுகிறார்? (இ) இப்பண்ணைகளைப் பார்வையிடுவதற்குத் திணைக்கள வாகனங்களை அவ்வுத்தியோகத்தர் பாவிப்பின் அதனால் அரசாங்கத்திற்கு ஒரு மாதத்தில் ஏற்படும் செலவெவ்வளவு? (ஈ) அவற்றைப் பார்வையிடுவதற்குத் தமது சொந்த வாகனத்தை அவ்வுத்தியோகத்தர் பாவிப்பின் அதனால் அரசாங்கத்திற்கு ஒரு மாதத்தில் ஏற்படும் செலவெவ்வளவு? (உ) இப்பண்ணைகளைப் பார்வையிடுவதற்கு அவரது சொந்த வாகனத்தை உபயோகித்ததன்பேரில் இந்நிதி வருடத்தின் கடந்த மாதங்களில் பிரயாண வகையில் அவருக்கு வழங்கப்பட்ட பணமெவ்வளவு? (ஊ) இப்பிரயாணங்களுக்குத் திணைக்கள வாகனங்களை உபயோகிக்காது பலதடவைகளில் தமது சொந்த வாகனத்தையே இவ்வுத்தியோகத்தர் உபயோகித்தாரென்பதை அவர் அறிவாரா? (எ) இப்பண விண்விரயத்தைத் தடுப்பதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா?

asked the Minister of Agriculture, Food, and Fisheries: (*a*) How many farms are there under the control of the Agricultural Officer (Farm Management and Productions) Matara? (*b*) How often a month does he inspect these farms? (*c*) How much does it cost the Government a month if this officer uses the departmental vehicles for these inspection trips? (*d*) How much does it cost the Government a month if this officer uses his private vehicle for the inspection trips? (*e*) What sum of money has been paid to him during the past few months of the current financial year as travelling, using his private vehicle for these trips? (*f*) Is he aware that this officer has on many occasions used his private vehicle for these trips without using the departmental vehicles? (*g*) Will he take action to prevent this wastage of money?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. එස්. රත්වත්තෙ (කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ වැඩ බලන ඇමති)**

*(கௌரவ ஸீ. எஸ். ரத்வத்த—பதில் விவசாய, உணவு, கடற்றொழில் அமைச்சர்)*

(The Hon. C. S. Ratwatte—Acting Minister of Agriculture, Food and Fisheries)

(අ) ගොවිපලවල් දොළහයි (12); (ආ) අඩු වශයෙන් මසකට එක් වරක් (සමහර ගොවිපලවල් මසකට දෙවරක් ද පරීක්ෂා කරනු ලැබේ). (ඉ) නඩත්තු කිරීමේ හා ක්ෂයවීමේ වියදම් හැර දිවවීමේ වියදම සඳහා රු. 400ක් පමණ රියැදුරන්ට ගෙවිය යුතු අතිකාල දීමනා හා යැපීම් දීමනා මීට ගණන් ගෙන නැත. (ඊ) මසකට රු. 500.00 දක්වා මුදලක්.

| (උ) මාසය—1964 | ගෙවූ කාර් සැතපුම් කුලිය | | |
|---|---|---|---|
| ජනවාරි | රුපියල් | 367 | 0 |
| පෙබරවාරි | ,, | 61 | 0 |
| මාර්තු | ,, | 147 | 40 |
| අප්‍රේල් | ,, | 75 | 0 |
| මැයි | ,, | 169 | 20 |
| ජූනි | ,, | 258 | 40 |
| ජූලි | ,, | 103 | 50 |
| අගෝස්තු | ,, | 50 | 40 |

1964 ජනවාරි මාසයේදී මාතර කෘෂිකර්ම නිලධාරි (ගොවිපල් පාලන හා නිෂ්පාදන) ට රජයේ වාහනයක් සපයා තිබුණේ නැත. (ඌ) නැත. මෙම නිලධාරියා පසු ගිය මාස කීපයේදී දෙපාර්තමේන්තු වාහන හා ඔහුගේ පුද්ගලික රථය පාවිච්චි කළ වාර ගණන දැක්වෙන සටහනක් පහත දැක්වේ. ඔහුගේ පුද්ගලික කාරය මොහු පාවිච්චි කරන්නේ :—(1) රාජකාරී වාහනය ක්‍රියාවිරහිත වූ විට, (2) රාජකාරී වාහනයේ රියදුරු නිවාඩුගොස් සිටින විට හා (3) පරිපාලන නිලධාරි නැන එම වාහනය පාවිච්චි කරන අවස්ථාවන්හිදීය.

| මාසය 1964 | දෙපාර්තමේන්තුවේ වාහනය පාවිච්චි කරන ලද දින ගණන | | පුද්ගලික මෝටර් රථය පාවිච්චි කරන ලද දින ගණන |
|---|---|---|---|
| පෙබරවාරි | 11 | ... | 4 |
| මාර්තු ... | 6 | ... | 6 |
| අප්‍රේල් ... | 6 | ... | 2 |
| මැයි ... | 9 | ... | 3 |
| ජූනි | 1 | ... | 5 |
| ජූලි ... | 9 | ... | 3 |
| අගෝස්තු | 7 | ... | 2 |

(එ) මට දැනගන්නට ලැබී ඇති අන්දමට මෙහිදී මුදල් නාස්තියක් සිදුවී නැති බව පෙනේ.

## පළමුවෙනි ශ්‍රේණියේ පාසැල් පරීක්ෂකවරුන්

## பாடசாலை வேலைப் பரிசோதகர்கள், முதலாந் தரம்

## INSPECTORS OF SCHOOL-WORKS, GRADE I

3. **ලක්ෂ්මන් ජයකොඩි මයා. (දිවුල පිටිය)**

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)*

(Mr. Lakshman Jayakody—Divulapitiya)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පළමුවෙනි ශ්‍රේණියේ පාසැල් වැඩ පරීක්ෂකවරුන් පත් කිරීම සඳහා 1964. 7. 28 වැනි දින සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ බව එතුමා දන්නවාද? (ආ) ප්‍රතිඵල දැනගත හැක්කේ කවදාද? උසස් වීම් දෙනු ලබන්නේ කවදාද?

*கல்வி அமைச்சரைக் கேட்ட வினா: (அ) முதலாந்தரப் பாடசாலை வேலைப் பரிசோதகர்களை நியமிப்பதற்கென 28.7.64 அன்று நேர் முகப் பரீட்சைகள் நடாத்தப்பட்டனவென்பதை அவர் அறிவாரா? (ஆ) பெறுபேறுகள் எப்பொழுது வெளியிடப்படும்? பதவி உயர்வுகள் எப்பொழுது வழங்கப்படும்?*

asked the Minister of Education: (*a*) Is he aware that interviews were held on 28.7.64 for appointment of Inspectors of Schoolworks, Grade I? (*b*) When will the results be known and when will promotions be given?

**ටී. බී. එම්. හේරත් මයා. (ග්‍රාම හා කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්—අධ්‍යාපන ඇමති වෙනුවට)**

*(திரு. ரீ. பி. எம். ஹேரத்—கிராம, கைத்தொழில் அபிவிருத்தி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி—கல்வி அமைச்சரின் சார்பாக)*

(Mr. T. B. M. Herath—Parliamentary Secretary to the Minister of Rural and Industrial Development—on behalf of the Minister of Education)

(අ) එසේය. (ආ) වැඩි ප්‍රමාදයක් නැතිව ප්‍රතිඵල නිකුත් කර උසස්වීම් දීමට අපේක්ෂා කෙරේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

කරුණා කර දිනයක්වත් දැනුම් දෙන්න. මේ ගත වන්නෙ තුන්වැනි මාස යයි. ප්‍රතිඵල නිකුත් කරන්න මාස 3 ක් ගත කර තිබෙනව.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரீ. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

වැඩි ප්‍රමාදයක් නැතිව ප්‍රතිඵල නිකුත් කරන බවයි මේ පිළිතුරේ සඳහන් වන්නේ.

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ වෙළඳ හලක් ඇහැලියගොඩ නගරයේ පිහිටුවීම

## எஹெலியகொடையில் விற்பனைத் திணைக்களக் கடை

## MARKETING DEPARTMENT DEPOT FOR EHELIYAGODA

4. පී. බී. විජයසුන්දර මයා. (කිරිඇල්ල)
(திரு. பீ. பி. விஜேசுந்தர—கிரியல்ல)
(Mr. P. B. Wijesundara—Kiriella)

කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ වෙළඳ හලක් ඇහැලියගොඩ නගරයේ පිහිටුවීම සඳහා පසුගිය අවුරුදු දෙක තිස්සේ යත්න දරන ලද බව එතුමා දන්නවාද? (ආ) මෙම කාර්‍ය්‍යය සඳහා සුදුසු "වේල්ස් ගොඩනැගිල්ල" නමැති රජයේ ගොඩනැගිල්ලක් ඇහැලියගොඩ ඇති බව එතුමා දන්නවාද?

கமத்தொழில், உணவு, கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) எஹெலியகொடை பட்டணத்தில் விற்பனைத் திணைக்களக் கடையொன்றினைத் திறப்பதற்குக் கடந்த இரு வருடங்களாக முயற்சிகள் எடுக்கப்பட்டன வென்பதை அவர் அறிவாரா? (ஆ) இத் தேவைக்குத் தகுதியான "வேல்ஸ் பில்டிங்" எனப்படும் அரசாங்கக் கட்டடமொன்று எஹெலியகொடையில் உண்டென்பதை அவர் அறிவாரா?

asked the Minister of Agriculture, Food and Fisheries: (*a*) Is he aware that efforts were made for the last two years to open a depot of the Marketing Department in the Eheliyagoda town? (*b*) Is he aware that there is a Government building called "Wales Building" in Eheliyagoda suitable for this purpose?

ගරු රත්වත්තෙ
(கௌரவ ரத்வத்த)
(The Hon. Ratwatte)

(අ) ඔව්. ඇහැලියගොඩ නගරයේ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ වෙළඳ සැලක් පිහිටුවන්නැයි 1962.7.14 දින කිරිඇල්ලේ ගරු මන්ත්‍රීතුමා ඉල්ලා ඇත. සැලක් පිහිටුවීම පිණිස ඇහැලියගොඩ ඇති "වේල්ස් ගොඩනැගිල්ල" 1962.8.29 දින රත්නපුර දිසාපතිගෙන් අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව ලබා ගත්තේය. මේ ගොඩනැගිල්ලට අවශ්‍ය අලුත්වැඩියාවන් ගැන ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරමින් සිටින අතර, ඇහැලියගොඩ නගරයෙහි සමූපකාර තොග වෙළඳ ආයතනයේ වෙළඳ සැලක් පිහිටුවන බව හෙළිවිය. 1963 පෙබරවාරි මස එම වෙළඳ සැල විවෘත කරන ලදී. සමූපකාර තොග වෙළඳ ආයතනයේ වෙළඳ සැලක් තිබෙන කුඩා නගරයක අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ වෙළඳ සැලක් විවෘත නොකිරීම ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිය වූ නිසාත්, "වේල්ස් ගොඩනැගිල්ල" වෙළඳ සැලක් වශයෙන් පිළියෙල කිරීමට රු. 5,000 ක පමණ මුදලක් වැය කිරීමට සිදුවන නිසාත්, ඇහැලියගොඩ නගරයෙහි සැලක් විවෘත කිරීමේ අදහස අත්හරින ලදී. ඒ බව ගරු මන්ත්‍රීතුමාට 1963.1.21 වැනි දින, අලෙවි කිරීමේ කොමසාරිස් විසින් දන්වා ඇත. ඉන්පසුව "වේල්ස් ගොඩනැගිල්ල" නැවත රත්නපුර දිසාපති තැනට භාරදෙන ලදී. (ආ) පිළිතුර (අ) යටතේ සඳහන් වී ඇත.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා. (කොට්ටාව)
(திரு. டீ. பி. ஆர். குணவர்தன—கொட்டாவ)
(Mr. D. B. R. Gunawardena—Kottawa)

ඒ ගොඩනැගිල්ල නැවත බාර ගන්නවා කියා ලියා එවා තිබෙනවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

ගරු රත්වත්තෙ
*(கௌரவ ரத்வத்த)*
(The Hon. Ratwatte)

ඊට පසු වේල්ස් ගොඩනැගිල්ල රත්නපුර දිසාපති තැනට ආපසු බාර දෙන ලදී.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

දිසාපතිතුමාට බාර දුන්නේ, අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ වෙළඳ සැලක් පිහිටුවීම පිණිසද?

ගරු රත්වත්තෙ
*(கௌரவ ரத்வத்த)*
(The Hon. Ratwatte)

කලින් ඒ ගොඩනැගිල්ල දිසාපතිතුමාගෙන් ලබාගත්තේ අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ වෙළඳ සැලක් විවෘත කිරීම පිණිසයි. නමුත් ස.තො.සේ ශාඛාවක් එහි පිහිටුවා ඇති නිසා අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ වෙළඳ සැලක් විවෘත නොකිරීමට තීරණය කළ හෙයින් ඒ ගොඩනැගිල්ල ආපසු බාර දුන්නා.

විජයසුන්දර මයා.
*(திரு. விஜேசுந்தர)*
(Mr. Wijesundara)

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ වෙළඳ සැලක් මේ ස්ථානයේ පිහිටුවන්නේ නැති නම් අපේ ඡන්ද කොට්ඨාශයේ වෙනත් ස්ථානයක් නම් කළොත්, එහි එම වෙළඳ සැලක් විවෘත කරනවාදැයි මම අහනවා.

ගරු රත්වත්තෙ
*(கௌரவ ரத்வத்த)*
(The Hon. Ratwatte)

ඒ ගැන කල්පනා කර බලන්නම්.

වාචික පිළිතුරු

**ලබුදූව රජයේ ගොවිපලේ කොන්දොස්තර එම්. එම්. සී. පියදාස සහ අනික් අයට විරුද්ධව නගා ඇති චෝදනා**

*அரசாங்க கமம், லபுதுவ: எம். எம். ஸி. பியதாச, சாரதி ஆகியோருக்கெதிரான குற்றச்சாட்டுக்கள்*

GOVERNMENT FARM, LABUDUWA: ALLEGATIONS AGAINST M. M. C. PIYADASA, CONDUCTOR, AND OTHERS

5. සේනපාල සමරසේකර මයා.
*(திரு. சேனபால சமரசேக்கர)*
(Mr. Senapala Samarasekara)

කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලබුදූව රජයේ ගොවිපලේ කොන්දොස්තර එම්. එම්. සී. පියදාස, රියැදුරු පී. වී. සරනේලිස් සහ කේ. එච්. ගුණසේන යන මහතුන්ට විරුද්ධව චෝදනා නගා ඇති බව එතුමා දන්නවාද? (ආ) මේ චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලද්දේද? (ඉ) එසේ නම්, එම පරීක්ෂණයේ තීරණ මොනවාද? (ඊ) නතරකර ඇති ඔවුන්ගේ වැටුප් වැඩිවීම් ගෙවන්නේ කවදාද?

*கமத்தொழில், உணவு, கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) லபுதுவ அரசாங்க கமத்தைச் சேர்ந்த இயக்குநர் திரு. எம். எம். ஸி. பியதாச, சாரதி திரு. பி. வீ. சரனேலிஸ், திரு. கே. எச். குணசேன ஆகியோருக்கெதிராகக் குற்றச்சாட்டுக்கள் செய்யப்பட்டுள்ளன வென்பதை அவர் அறிவாரா? (ஆ) இக்குற்றச்சாட்டுக்கள் பற்றி விசாரணையொன்று நடாத்தப்பட்டதா? (இ) அவ்வாறாயின், விசாரணையின் முடிவென்ன? (ஈ) நிறுத்தப்பட்டுள்ள அவர்களின் சம்பள உயர்ச்சிகள் எப்பொழுது வழங்கப்படும்?*

asked the Minister of Agriculture, Food and Fisheries: (a) Is he aware that allegations have been made against Messrs M. M. C. Piyadasa, Conductor, P. V. Saranelis, Driver, and K. H. Gunasena of the Government Farm, Labuduwa? (b) Was an inquiry held into these allegations? (c) If so, what were the findings? (d) When will their increments which have been stopped be paid?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු රත්වත්තෙ**
*(கௌரவ ரத்வத்த)*
(The Hon. Ratwatte)

(අ) ඔව්. (ආ) ඔව්. මූලික පරීක්ෂණයක් පවත්වා එයින් මතු වූ කරුණු උඩ චෝදනා පත්‍ර නිකුත් කර ඇත. විධිමත් විනයානුකූල පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙම පරීක්ෂණය මේ මස තුළදී අවසන් කිරීමට බලාපොරොත්තු වේ. (ඉ) පැන නොනඟී. (ඊ) විනයානුකූල පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ගන්නා තීරණ වලින් පසුවිය.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ගාල්ල)**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க—காலி)*
(Dr. W. Dahanayake—Galle)

තමුන්නාන්සේ දන්නවාද, මේ සේවක යින් තුන්දෙනාගෙන් දෙදෙනකුගේ පඩි වැඩිවීම් නවත්වා තිබෙන අතර එක් කෙනකුගේ පඩි වැඩිවීම් දී තිබෙන බව? ඇයි, ඒ විදියේ වෙනසක් කර තිබෙන්නෙ.

**ගරු රත්වත්තෙ**
*(கௌரவ ரத்வத்த)*
(The Hon. Ratwatte)

ඒ ගැන පරීක්ෂා කර බලන්නම්.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டப்ளியு. தகநாயக்க)*
(Dr. W. Dahanayake)

තමුන්නාන්සේ දන්නවාද, පේරාදෙණි යේ ප්‍රධාන කාර්යාලය මේ සම්බන්ධයෙන් දූෂණ ක්‍රිය වල යෙදෙන බව? ඒ නිසා අපක්ෂපාත විභාගයක් පැවැත්වීමට තමුන් නාන්සේ උත්සාහ කරනවාද?

**ගරු රත්වත්තෙ**
*(கௌரவ ரத்வத்த)*
(The Hon. Ratwatte)

හොඳයි; ඒ ගැන බලන්නම්.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டி. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මේ පරීක්ෂණය මේ මසය තුළදී අවසන් කරනවායයි කියනවා. මේ සඳහා මෙපමණ කල් සිටියේ මේ ගරු සභාවේ ප්‍රශ්නයක් අසන තෙක්ද?

**ගරු රත්වත්තෙ**
*(கௌரவ ரத்வத்த)*
(The Hon. Ratwatte)

නැහැ. පරීක්ෂණය පැවැත්වීමට කටයුතු යොදා ඇත්තේ මීට කලිනුයි.

## සීමාසහිත යග්ගහ විවිධ සේවා සමුපකාර සමිතිය, අක්මීමන

*யக்கஹா பலநோக்குக் கூட்டுறவுச் சங்கம்: அக்மீமன*

YAGGAHA MULTI-PURPOSE CO-OPERATIVE SOCIETY LTD: AKMEEMANA

6. **සේනපාල සමරසේකර මයා.**
*(திரு. சேனபால சமரசேக்கர)*
(Mr. Senapala Samarasekara)

අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැප යීම් කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අක්මීමන ඡන්දදායක කොට්ඨාශයේ සීමාසහිත යග්ගහ විවිධ සේවා සමුපකාර සමිතියේ, 1961 අගෝස්තු මස 1 වැනි දින හා 1962 මැයි මස 31 වැනි දින අතර කාලය තුළදී මුදලින් රුපියල් 17,665.80 ක මුදල් නාස්තියක් සිදු වී ඇති බව එතුමා දන්නවාද? (ආ) මෙම නාස්තිය ගැන වගකිවයුත්තෝ කවරහුද? එතුමා ඔවුන්ගේ නම් සඳහන් කරනවාද? (ඉ) මෙම මුදල එකී සමිතියට අයකර ගනු පිණිස පවරන ලද නඩුවේ බේරුම්කරුගේ ගාස්තු වශයෙන් ගාල්ලේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්ට රුපියල් 300 ක මුදලක් 1962 දී එකී සමිතිය ගෙවූ බව එතුමා දන්නවාද? (ඊ) එතරම් විශාල මුදලක් අයකර ගැනීම මෙතෙක් අතපසු කිරීම සම්බන්ධයෙන් වගකිව යුත්තා කවරෙක්ද? (උ) එතුමා යථා කාලයේදී මේ කරුණ සම්බන්ධයෙන් ක්‍රියා කරනවාද?

*உள்நாட்டு, வெளிநாட்டு வர்த்தக, விநியோக அமைச்சரைக் கேட்ட வினா: (அ) அக்மீமனத் தேர்தற் றொகுதியிலுள்ள யக்கஹா பல நோக்குக் கூட்டுறவுச் சங்கத்தின் 1961, ஆகஸ்ட் 1 ம் தேதியிலிருந்து 1962, மே 31 ம் தேதிக் கிடைப்பட்ட காலத்தில் ரூபா 17,665.80 வீணாக விரயம் செய்யப்பட்ட தென்பதை அவர் அறிவாரா? (ஆ) இவ் வீண்விரயத்துக்குப் பொறுப்பாயுள்ளவர்கள் யார்? அவர்களின் பெயர்களை அவர் தெரி விப்பாரா? (இ) மேற்படி சங்கத்திற்கு இப் பணத்தை அறவிடுவதற்கெனத் தொடரப் பட்ட வழக்கு சம்பந்தமாக மத்தியஸ் தராகக் கடமையாற்றியதன் பேரில் காலிக் கூட்டுறவு அபிவிருத்தி உதவி ஆணையாள ருக்கு இச்சங்கம் 1962 இல் 300 ரூபா கொடுத் துள்ள தென்பதை அவர் அறிவாரா? (ஈ)*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සේනපාල සමරසේකර මයා.]

அத்தகைய பெருந் தொகையான பணத்தை அறவிடுவதில் இற்றைவரை காலதாமதமேற் படுவதற்குப் பொறுப்பாயுள்ளவர் யார்? (உ) இவ்விடயம் சம்பந்தமாய் காலக் கிரமத்தில் அவர் நடவடிக்கை யெடுப்பாரா?

asked the Minister of Internal and External Trade and Supply: (a) Is he aware that there was a wastage of Rs. 17,665.80 in cash in the Yaggaha Multi-purpose Co-operative Society Ltd. in the Akmeemana electorate during the period 1st August, 1961, and 31st May, 1962? (b) Who are responsible for this wastage? Will he give their names? (c) Is he aware that in 1962 the said society had paid a sum of Rs. 300 to the Assistant Commissioner of Co-operative Development, Galle, as fees for the arbitrator in connection with the case filed in order to recover this money for the said society? (d) Who is responsible for delaying the recovery of such large sum of money so far? (e) Will he take action in this matter in due course?

**ගරු තෙන්නකෝන්**
*(கௌரவ தென்னகோன்)*
**(The Hon. Tennekoon)**

(අ) ඔව්. (ආ) වගකිව යුත්තන් දැන ගත හැක්කේ තීරක තීන්දුවකින් පසුවය. සමිතිය විසින් හිටපු කළමනාකරුට සහ හිටපු ලේකම්ටත් හිටපු කාරක සභිකයින්ටත් විරුද්ධව මේ මුදල අය කර ගැනීමට තීරක තීන්දුවක් ඉල්ලා ඇත. (ඉ) ගාල්ලේ සහකාර සමුපකාර කොමසාරිස් මේ නඩුවේ බේරුම්කරු වශයෙන් පත් කර නැත. මේ තීරක විභාගය සඳහා රු. 300ක් ඔහු ළඟ තැන්පත් කර තිබෙන්නේ මේ ගැන පත් කරනු ලබන බේරුම්කරුගේ ගාස්තුව වශයෙනි. (ඊ) මේ තීරක විභාගය සඳහා පත් කිරීමට බලාපොරොත්තු වුණ ගාල්ලේ අධිනීතිඥ මහතෙකු මහේස්ත්‍රාත් කෙනෙකු වශයෙන් පත්වීමක් ලැබ ගිය නිසා ඒ වෙනුවට වෙනත් සුදුසු බේරුම්කරුවෙකු පත් කිරීමට ක්‍රියා කර ගෙන යනු ලැබේ. (උ) ඔව්.

**සේනපාල සමරසේකර මයා.**
*(திரு. சேனபால சமரசேக்கர)*
(Mr. Senapala Samarasekara)

විභාගයක් පැවැත්වීම සඳහා රුපියල් 300 ක් බැන්දේ 1962 දී. නමුත් මෙතෙක් කල් මේ මුදල—රු. 17,000—අය කරගැනීමට කටයුතු යොදා නැහැ. මේ මුදල අය කර ගැනීමට කටයුතු යොදන්නේ ඊට වගකිව යුත්තන් මැරී ගියාට පසුවද? මේ තරම් මුදලක අලාභයක් සමිතියට දැරීමට නොහැකි නිසා කරුණා කර වැඩ බලන ඇමතිතුමා මේ සම්බන්ධයෙන් ඉක්මනින් කටයුතු කරනවාද?

**ගරු තෙන්නකෝන්**
*(கௌரவ தென்னகோன்)*
(The Hon. Tennekoon)

ප්‍රමාද වැඩි බව මම පිළිගන්නවා. ඉක්මනින් මේ පිළිබඳව පරීක්ෂා කිරීමට දැනුම් දෙන්නම්.

## එල්ලාවල විද්‍යාලය, කිරිඇල්ල: තත්ත්වය උසස් කිරීම

### எல்லாவல வித்தியாலயத்தைத் தரமுயர்த்தல், கிரியெல்ல

### UPGRADING OF ELLAWALA VIDYALAYA, KIRIELLA

**7. විජයසුන්දර මයා.**
*(திரு. விஜேசுந்தர)*
**(Mr. Wijesundara)**

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) රත්නපුර දිස්ත්‍රික්කයේ, කිරිඇල්ල ඡන්දදායක කොට්ඨාශයේ එල්ලාවල විද්‍යාලය මහා විද්‍යාල තත්ත්වයට උසස් කිරීමට එතුමා ක්‍රියා කරනවාද? (ආ) නො එසේ නම්, ඒ මන්ද? (ඉ) එකී පාසලේ ගුරු දෙගුරු සමිතියේ ඉල්ලීම පරිදි මෙම පාසලට මහා විද්‍යාල තත්ත්වය හෝ සුදු කාර්මික විද්‍යාල තත්ත්වය දීමට එතුමා ක්‍රියා කරනවාද?

*கல்வி அமைச்சரைக் கேட்ட வினா: (அ) இரத்தினபுரி மாவட்டத்தைச் சேர்ந்த கிரியெல்லத் தேர்தற் றொகுதியிலுள்ள எல்லாவல வித்தியாலயத்தை ஒரு மகா வித்தியாலயமாகத் தரமுயர்த்துவதற்கு அவர் நடவடிக்கை யெடுப்பாரா? (ஆ) அன்றேல், என்? (இ) மேற்படி பாடசாலையின் பெற்றோர்—ஆசிரியர்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கள் சங்கத்தினால் வேண்டிக்கொள்ளப்பட்டவாறு, இப்பாடசாலையை ஒரு மகா வித்தியாலயமாகவோ அல்லது கனிட்ட கைத்தொழிற் பாடசாலையாகவோ தரமுயர்த்துவதற்கு அவர் நடவடிக்கையெடுப்பாரா ?

asked the Minister of Education: (*a*) Will he take action to upgrade Ellawala Vidyalaya in the Kiriella electorate in Ratnapura District to a Maha Vidyalaya ? (*b*) If not, why ? (*c*) Will he take action to grant this school the status of a Maha Vidyalaya or a Junior Industrial School as requested by the Parent-Teachers' Association of the said school ?

ටී. බී. එම්. හේරත් මයා.—(අධ්‍යාපන ඇමති වෙනුවට)

(திரு. ரீ. பி. எம். ஹேரத்—கல்வி அமைச்சர் சார்பாக)

(Mr. T. B. M. Herath—on behalf of the Minister of Education)

(අ) නැත. (ආ) මහා විද්‍යාල තත්ත්වයක් දීමට මෙහි සහ මෙයට අවට පිහිටි විද්‍යාලවල පශ්චාත් ප්‍රාථමික ශිෂ්‍ය සංඛ්‍යාවන් ප්‍රමාණවත් නොවන අතර, මෙයට හැතැප්ම 4ක් දුරින් මහා විද්‍යාලයක් තිබීම (ඉ) මෙය මහා විද්‍යාලයක් කිරීමට අදහස් නොකෙරේ. කාර්මික විද්‍යාලයක් ලෙස මෙය උසස් කිරීමට දැනට පිළිවෙලක් නැත.

විජයසුන්දර මයා.

(திரு. விஜேசுந்தர)

(Mr. Wijesundara)

මීට වඩා අඩු සැතපුම් ගණන් ඇතුළත තිබෙන විද්‍යාල, මහා විද්‍යාල බවට පත් කර තිබෙන බව මම ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට දැනුම් දීමට කැමතියි. මේ විද්‍යාලයේ සිට සැතපුම් 6 ක් ඈතින් එක මහා විද්‍යාලයක් තිබෙන්නෙ. අනික් පැත්තෙන් මහා විද්‍යාලයක් තියෙන්නෙ සැතපුම් 7 ක් ඈතින්. මේ සංඛ්‍යා ගැන පරීක්ෂා කර බලා මෙම විද්‍යාලයට මහා විද්‍යාල තත්ත්වය දෙන ලෙස ඉල්ලා සිටිනව. එසේ කිරීම අපහසු නම් සුළු කාර්මික විද්‍යාලයක තත්ත්වයට උසස් කරන ලෙස ඉල්ලා සිටිනව.



ටී. බී. එම්. හේරත් මයා.

(திரு. ரீ. பி. எம். ஹேரத்)

(Mr. T. B. M. Herath)

එය ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට යොමු කරනව.

### ර/උඩුවක මහා විද්‍යාලයට විද්‍යා රසායනාගාරයක්

### ஆர்/உடுவாக்க மகா வித்தியாலயத்திற்கு விஞ்ஞான கூடம்

### SCIENCE LABORATORY FOR R/UDUWAKA MAHA VIDYALAYA

8. විජයසුන්දර මයා.

(திரு. விஜேசுந்தர)

(Mr. Wijesundara)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ර/උඩුවක මහා විද්‍යාලයට සුළු විද්‍යා රසායනාගාරයක් අවශ්‍ය බව අවුරුදු දෙකකට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළිගත් බව එතුමා දන්නවාද ? (ආ) එසේ නම්, ඉහත සඳහන් මහා විද්‍යාලයට අප්‍රමාදව විද්‍යා රසායනාගාරයක් ලබා දීමට එතුමා ක්‍රියා කරනවාද ?

கல்வி அமைச்சரைக் கேட்ட வினா: (அ) R/உடுவாக்க மகாவித்தியாலயத்திற்கு சிறிய விஞ்ஞான ஆய்கூடமொன்று தேவையென்பதை இரண்டு வருடங்களுக்கு முன்னரேயே கல்வித் திணைக்களம் ஏற்றுக்கொண்டதென்பதை அவர் அறிவாரா? (ஆ) அவ்வாறாயின், மேற்படி மகாவித்தியாலயத்திற்கு மேலும் காலதாமதமின்றி விஞ்ஞான ஆய்கூடமொன்றை அமைப்பதற்கு அவர் நடவடிக்கையெடுப்பாரா?

asked the Minister of Education: (*a*) Is he aware that the Department of Education admitted the necessity of a minor science laboratory to R/Uduwaka Maha Vidyalaya, two years ago ? (*b*) If so, will he take action to provide a science laboratory to the said Maha Vidyalaya without delay ?

ටී. බී. එම්. හේරත් මයා.

(திரு. ரீ. பி. எம். ஹேரத்)

(Mr. T. B. M. Herath)

(අ) නැත. (ආ) ලබන මුදල් වර්ෂයේදී අළුත් විද්‍යාගාර තැනීමට විද්‍යාල තෝරන විට අනිකුත් විද්‍යාල සමග මෙම විද්‍යාලයේ අවශ්‍යතාවයන්ද සලකා බලන්නෙමි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

මෙබඳු ප්‍රදේශවල මහා විද්‍යාලවලට සුළු වශයෙන් හෝ විද්‍යාගාර දීම මේ විධියට ප්‍රමාද කරන්නෙ ඇයි? උඩුවක මහා විද්‍යාලය තිබෙන ප්‍රදේශය විශේෂ ලෝහ වර්ග තිබෙන ප්‍රදේශයක්. ඒ නිසා ඒ විධියේ විද්‍යාගාර ඒ ප්‍රදේශවල විද්‍යාලවලට යන ශිෂ්‍යයන්ට ඇති කර දුන්නොත් ඒ ප්‍රදේශවල තිබෙන ලෝහ වර්ග සොයා ගැනීමට ඔවුන් වැඩි උනන්දුවක් දරණවා. ඒ නිසා උඩුවක මහා විද්‍යාලයට ඉක්මනින්ම විද්‍යාගාරයක් දිය යුතු බව මම ප්‍රකාශ කරනවා.

## මොණරාගල අධ්‍යාපන කායර්‍යාලයට හා ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායර්‍යාලයට ටෙලිෆෝන් පහසුකම්

கல்வி அலுவலகம், மாவட்ட இறைவரி உத்தியோகத்தர் அலுவலகம் ஆகியவற்றிற்குத் தொலைபேசிகள், மொனருகலை

TELEPHONES FOR EDUCATION OFFICE AND D. R. O'S OFFICE, MONERAGALA

9. ඩබ්ලිව්. ජී. එම්. ඇල්බට් සිල්වා මයා. (මොනරාගල)
(திரு. டப்ளியு. ஜீ. எம். அல்பேட் சில்வா—மொனருகல)
(Mr. W. G. M. Albert Silva—Moneragala)

තැපැල් හා විදුලි පණිවුඩ කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මොණරාගල අධ්‍යාපන කායර්‍යාලයට හා ප්‍රාදේශීය ආදායම් නිලධාරි කායර්‍යාලයට ටැලිපෝන් ඉල්ලා කොපමණ කලක් ගත වී තිබේද? (ආ) ටැලිපෝන් ලබා දීමේ ප්‍රමාදයට හේතුව කුමක්ද? (ඉ) මේ ඉතා මත්ම වැදගත් රජයේ කායර්‍යාල දෙකට ටැලිපෝන් ලබා දීමට එතුමා ක්‍රියා කරනවාද? (ඊ) එසේ නම්, ඒ කවදා ද?

தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) மொனருகலையில் உள்ள கல்வி அலுவலகம், மாவட்ட இறைவரி உத்தியோகத்தர் அலுவலகம் ஆகியவற்றிற்குத் தொலைபேசிகள் அளிக்கும்படி வேண்டுதல்விடப்பட்டு எவ்வளவு காலமாகிறது? (ஆ) தொலைபேசிகள் அளிப்பதிலுள்ள காலதாமதமென்ன? (இ) இவ்விரு முக்கிய அரசாங்க அலுவலகங்களுக்கும் தொலைபேசிகள் வழங்குவதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா? (ஈ) ஆமெனில், எப்பொழுது?

asked the Minister of Posts and Telecommunications: (a) How long is it since requests were made for telephones to the Education Office and the D. R. O's Office, Moneragala? (b) What is the delay in providing telephones? (c) Will he take action to provide telephones for these two most important Government offices? (d) If so, when?

ආර්. එස්. පෙරේරා මයා. (තැපැල් හා විදුලි පණිවුඩ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. ஆர். எஸ். பெரேரா—தபால், தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. R. S. Perera—Parliamentary Secretary to the Minister of Posts and Telecommunications)

(අ) පිළිවෙළින් අවුරුදු 2 යි මාස 11 ක් හා අවුරුද්දයි මාස 3 ක් වේ. (ආ) පළමු වන කාරණා සම්බන්ධයෙන් අවුරුදු 1½ ක ප්‍රමාදයක් ඇතිවූයේ හුවමාරු ස්ථානයේ හිස් අංක හිඟකම නිසා හා අවශ්‍ය අඳුමේ යතුරු පුවරුවක් නොතිබීම නිසාය. ඉතිරි ප්‍රමාදය වූයේ කායර්‍ය මණ්ඩල හිඟකම නිසාත් කලින් ආරම්භ කරන ලද හදිසි වැඩ තිබුණ නිසාත්ය. (ඉ) ඔව්. (ඊ) මාස 1½ ක් පමණ.

ඇල්බට් සිල්වා මයා.
(திரு. அல்பேட் சில்வா)
(Mr. Albert Silva)

ඒ පිළිතුරෙන් කිව්, ප්‍රමාදය සිදු වුණේ ටෙලිපෝන් අංක නැතිකම නිසාය කියා. මොණරාගල හුවමාරු ස්ථානයේ ටෙලිපෝන් අංක සිය ගණනක් තියෙනවා. අවුරුදු දෙකකුත් මාස 11 ක් මේ වැදගත් ප්‍රශ්නය ප්‍රමාද කරල තියෙනවා. දැන් පාර්ලිමේන්තු ලේකම්තුමා කිව්, මාස එකහමාරකින් මෙය ඉදි කරනවාය කියා. එය නියත වශයෙන්ම මාස එකහමාරකදී කරනවද, මේ ප්‍රමාදය සිදු වීමට හේතුව කුමක්ද යන්න සොයා බලනවාද කියා මම අහන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. එස්. පෙරේරා මයා.**
*(திரு. ஆர். எஸ். பெரேரா)*
(Mr. R. S. Perera)

අංක නැතිකම ප්‍රමණක් නොවෙයි, අවශ්‍ය අන්දමේ යතුරු පුවරුවක් නොතිබීමත් ප්‍රමාදයට හේතුවක් බව පිළිතුරේ කියා තිබෙනවා. මාස එකහමාරකින් මෙය ඉදි කිරීමට පොරොන්දු වෙනවා.

## ගම්පොළ පාසැල් ගොඩනැගිලි සෑදීමේ වැඩ

*பாடசாலைகளின் கட்டட வேலை, கம்பளை*

## CONSTRUCTION WORK ON SCHOOL-BUILDINGS, GAMPOLA

10. **එල්. බී. දසනායක මයා.** (ගම්පොළ)
*(திரு. எல். பி. தஸநாயக்க—கம்பளை)*
(Mr. L. B. Dassanayake—Gampola)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගම්පොළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා අවුරුදු ගණනාවක සිටම අධ්‍යාපන දෙපාර්තමේන්තුවට කරුණු සැළ කර සිටියත් පහත සඳහන් පාසැල් ගොඩනැගිලි සෑදීමේ වැඩ නිම කර නැති බව එතුමා දන්නවාද? (1) මහ/අටබාගේ ඉහළ ගම ප්‍රාථමික පාසැල, (2) මහ/ඉඟුරුවත්ත පාසැල, (3) මහ/උඩෝවිට පාසැල, (4) මහ/ඉල්ලගොල්ල පාසැල, (5) මහ/දේවිට පාසැල, (6) මහ/කලුගමුව පාසැල, (7) මහ/උනම්බුව පාසැල, (8) මහ/ග්‍රෝහිල් පාසැල, (9) මහ/රත්මල්කඩුව පාසැල, (10) මහ/රාජානන්ද පාසැල. (ආ) ගොඩනැගිලි සෑදීමේ වැඩ නිම කරන්නේ කවදාද?

*கல்வி அமைச்சரைக் கேட்ட வினா: (அ) கீழ்க்காணும் பாடசாலைகளின் கட்டடங்களை அமைப்பது சம்பந்தமாகக் கம்பளைப் பாராளுமன்ற உறுப்பினர் அநேக வருடங்களாக கல்வித் திணைக்களத்திற்கு முறையீடுகள் செய்திருந்துங்கூட, இதுவரை அக்கட்டட வேலைகள் பூர்த்தியாக்கப்படவில்லையென்பதை அவர் அறிவாரா :—(1) K/அட்டபாகே இஹல கம ஆரம்ப பாடசாலை, (2) K/இங்குறுவெத்த பாடசாலை, (3) K/உடோவிற்ற பாடசாலை, (4) K/இல்லாகொல்ல பாடசாலை, (5) K/தேவிற்ற படசாலை. (6) K/கல்கமுவ பாடசாலை, (7) K/உனாம்புவ பாடசாலை. (8) K/குறோஹில் பாடசாலை, (9) K/இரத்மல்கடுவ பாடசாலை, (10) K/இராஜானந்த பாடசாலை? (ஆ) இக்கட்டட அமைப்பு வேலைகள் எப்பொழுது பூர்த்தியாக்கப்படும்?*

asked the Minister of Education: (a) Is he aware that although the Member for Gampola has made representations to the Department of Education, for a number of years the construction work of the following school buildings has not been completed: (1) K/Atabage Ihalagama Primary School, (2) K/Inguruwatta School, (3) K/Udowita School, (4) K/Illagolla School, (5) K/Devita School, (6) K/Kalugamuwa School, (7) K/Unambuwa School, (8) K/Growhill School, (9) K/Ratmalkaduwa School, (10) K/Rajananda School? (b) When will the construction work be completed?

**ටී. බී. එම්. හේරත් මයා.** (අධ්‍යාපන ඇමති වෙනුවට)
*(திரு. ரீ. பி. எம். ஹேரத்—கல்வி அமைச்சர் சார்பில்)*
(Mr. T. B. M. Herath—on behalf of the Minister of Education)

(අ) මෙහි පහත දැක්වෙන පාසල්වල හැර ගම්පොළ මන්ත්‍රීවරයා විසින් සඳහන් කරන අනෙක් පාසල්වල ගොඩනැගිලි ඉදි කරන ලෙස ඔහු විසින් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට කරුණු සැල කර ඇති බවත් නොදනිමි. 1. මහ/රත්මල්කඩුව පාසල, 2. මහ/ඉඟුරුවත්ත පාසල, 3. මහ/උඩෝවිට පාසල, 4. මහ/අටබාගෙ ඉහළගම පාසල, 5. මහ/ඉල්ලගොල්ල පාසල. (ආ) මහ/රත්මල්කඩුව පාසැලේ ගොඩනැගිලි ඉදි කර තිබේ. මහ/ඉඟුරුවත්ත හා මහ/උඩෝවිට යන පාසල්වල ඉඩම් අයත් කර ගැනීමේ කටයුතු අවසන් වූ විට එම පාසල් වලට ගොඩනැගිලි තැනීමට ක්‍රියා කරනු ඇත. මහ/අටබාගෙ, මහ/දෙවිට, මහ/කළුගමුව, මහ/උණම්බුව, මහ/ග්‍රෝහිල් සහ මහ/රාජානන්ද යන පාසල්වල දැනට තිබෙන ඉඩකඩ ප්‍රමාණවත්ය. අරමුදල් ලබාගත හැකි වූ විට මහ/ඉල්ලගොල්ල පාසලට ගොඩනැගිලි සපයා දෙනු ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**දසනායක මයා.**
*(திரு. தசநாயக்க)*
(Mr. Dassanayake)

ඇමතිතුමා වෙනුවෙන් පාර්ලිමේන්තු ලේකම්තුමා ඉදිරිපත් කළ පිළිතුරෙන් කියා තිබෙන්නෙ ගම්පොළ මන්ත්‍රීවරයා විසින් මේ ගැන කරුණු සැල කර තිබෙන වගක් නොදන්න බවයි. මේ ප්‍රශ්නයට උත්තර දෙන්නට ඒ අමාත්‍යාංශය භාර ඇමතිතුමත්, පාර්ලිමේන්තු ලේකම්තුමත් කෝ කියා මම පළමුවෙන්ම අහන්න කැමතියි. ඒ ප්‍රශ්නයට උත්තර නැත්නම් මම කියන්න කැමතියි, මේ ප්‍රශ්නය ගැන ගම්පොළ මන්ත්‍රීවරයා වශයෙන් මා එවූ ලියුම් ගැන, විදුලි පුවත් ගැන, පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කළ කරුණු ගැන ඇමතිතුමත්, පාර්ලිමේන්තු ලේකම්තුමත් නොදන්නව නම් එය මගේ වරදක් නොව ඇමතිතුමාගේ හෝ පාර්ලිමේන්තු ලේකම්තුමාගේ පාලනයේ වරදක් බව. ඒ දෙපාර්තමේන්තුව ඒ තරම් දුර්වල තත්ත්වයකින් පාලනය වීම ගැන මම කනගාටු වෙනව. මා මේ ඉල්ලීම අවුරුදු 4 ක් තිස්සෙ ඉදිරිපත් කරන එකක්. ඒ ගැන මම ටිකක් කියන්න කැමතියි. මහ/අටබාගෙ ඉහළගම ප්‍රාථමික පාසැල ග්‍රාම සංවර්ධන සමිති ශාලාවකයි, පිහිටුවා තියෙන්නෙ. මහ/ඉඟුරුවත්ත පාඨශාලාව බොහොම අබලන් තත්ත්වයකයි, තියෙන්නෙ. ළඟදී රජයට පවරා ගත් එම පාසැල තාවකාලික ගොඩනැගිල්ලකයි පවත්වාගෙන යන්නෙ. මහ/උඩෝවිට පාසැලත් තාවකාලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන එකක්. මහ/ඉල්ලගොල්ල පාසැලත් පිහිටුවා තියෙන්නෙ ගේකයි. එහි පලයක් කඩා වැටෙන්න ගිහින් තියෙනව. මහ/දෙවිට පාසැලත් ගේකයි පවත්වාගෙන යන්නෙ. මහ/කලුගමුව පාසැලත් පැරණි එකක්. එයත් කඩා වැටෙන තත්ත්වයකයි, තියෙන්නෙ. දැන් මෙම ප්‍රශ්නයට පිළිතුරු දුන් පාර්ලිමේන්තු ලේකම්තුමා ඒ ගැන දන්නව ඇති. මහ/උනම්බුව පාසැලත් ළඟදී රජයට පවරාගත් එකක්. එයත් පවත්වාගෙන යන්නෙ තාවකාලික ගොඩනැගිල්ලකයි. මහ/ග්‍රෝහිල් පාසැලත් තාවකාලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන එකක්. මහ/රත්මල්කඩුව පාසැලත් ඒ විධියයි. එය පවත්වාගෙන යන්නෙ බණ ශාලාවකයි. මහ/රාජානන්ද පාසැල සාදා තිබෙන්නෙ උණ ගස්වලින්. එයත් කඩා වැටෙන්න ලඟයි. මෙම පාසැල්වල ඉගෙනීම ලබන 1,500 ක 2,000 ක පමණ ශිෂ්‍යයින්ට ආරක්ෂාව සලසන්න ඕනෑ. යම් විධියකින් මෙම පාසැලක් කඩා වැටී ඒ අයගෙන් හත් අට දෙනෙක්, දහ පහලොස් දෙනෙක් හෝ විසි තිස් දෙනෙක් මිය ගියොත් ඒ ගැන ගරු ඇමතිතුමා වග කියනවද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

එම ප්‍රශ්නයට උත්තර මා දුන් පිළිතුරේ සඳහන් වුණා. මහ/රත්මල්කඩුව පාසැල සඳහා ගොඩනැගිල්ලක් ඉදි කර තිබෙන බවත් මහ/ඉඟුරුවත්ත සහ මහ/උඩෝවිට යන පාසැල්වලට ගොඩනැගිලි සෑදීම සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමට කටයුතු යොදාගෙන යන බවත් සහ එම ඉඩම් ලබා ගත් වහාම එම ගොඩනැගිලි සාදන බවත් එම පිළිතුරේ සඳහන් වෙනව. ඉඩම් ලබා ගන්න පෙර ගොඩනැගිලි සාදන්න බැරි බව ගරු මන්ත්‍රීතුමා පිළිගන්නව ඇති. මහ/ඉල්ලගොල්ල පාසැල සඳහා ගොඩනැගිලි සෑදීම අවශ්‍ය බව පිළිතුරේ සඳහන් කර තිබුණා. දී තිබෙන පිළිතුරේ හැටියට අනිකුත් පාසැල් පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් පරිදි ඉඩකඩ තිබෙන බවයි, පෙනෙන්නෙ. එහෙත් ගරු මන්ත්‍රීතුමා දන්වන ලද කරුණු ගරු ඇමතිතුමාගෙ සැලකිල්ලට භාජන කරවන්නම්.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ඉඩම් ලබා ගැනීමට බැරිය කියනව. හදිසියෙ වුණත් ඉඩමක් ලබා ගැනීමට හැකි වන පරිද්දෙන් විශෙෂ පණතක් පසුගිය දිනක මෙම ගරු සභාවට ඉදිරිපත් කළා නේද? ඒ අනුව වහාම අවශ්‍ය ඉඩම් පවරා ගන්න පුළුවන් නේද? [බාධා කිරීමක්.]

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඉඩම් අත්පත් කර ගන්න බැරිය කීවෙ නැහැ. ඉඩම් අත්පත් කර ගත්තාට පසුව ගොඩනැගිලි සාදන බවයි, කීවෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

CEYLON PRESS BILL

ලක්ෂ්මන් රාජපක්‍ෂ මයා. (තිස්සමහාරාමය)
(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ—திஸ்ஸமஹாராம)
(Mr. Lakshman Rajapaksa—Tissamaharama)

Before the commencement of Public Business may I know when the Press Bill will be taken up for discussion? I have already given notice that the Bill be taken up on the 2nd February, 1965, for discussion.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා (මුදල් ඇමති)
(கௌரவ கலாநிதி என். எம். பெரேரா—நிதி அமைச்சர்)
(The Hon. Dr. N. M. Perera—Minister of Finance)

How can you give notice?

ජේ. ආර්. ජයවර්ධන මයා. (දකුණු කොළඹ පළමුවන මන්ත්‍රී)
(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்புத் தெற்கு முதலாம் அங்கத்தவர்)
(Mr. J. R. Jayewardene—First Colombo South)

The hon. Member for Tissamaharama said that he had given notice that the Press Bill should be taken up on the 2nd February, 1965. We want to know when the Press Bill will be debated. It is a very important question. I heard the Hon. Leader of the House saying "tomorrow".

ගරු ද සොයිසා සිරිවර්ධන
(கௌரவ டி சொய்சா சிறிவர்தன)
(The Hon. de Zoysa Siriwardena)

I moved the Second Reading.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

That clearly is against the Standing Orders of this House. Section 77 (1) says:

"All Bills brought from the Senate shall lie upon the Table until a day is named for second reading."

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

This is an unnecessary point of Order.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

Section 77 (2) says:

"At any time after the reading of a Message recording that a Bill has been brought from the Senate, a member may inform the Clerk at the Table that he will sponsor the Bill and name a day for second reading (not being less than five clear days after the giving of such notice)."

Section 77 (3) says:

"The Clerk shall thereupon endorse the Member's name upon the back of the Bill and record in the minutes that the said Bill has been read a first time and ordered to be read a second time upon the day named and to be printed."

I understand from the hon. Member for Tissamaharama that he has given notice to the Clerk at the Table that he will sponsor the Ceylon Press Bill and mentioned the 2nd of February as the day for the Second Reading. The Hon. Minister of Labour has adopted the procedure applicable to Bills presented in this House. If you would look at Section 50 of our Standing Orders you will see that it states as follows:

"A Minister or Parliamentary Secretary may after notice present a Bill without an order of the House for its introduction and when a Bill is so presented at the commencement of public business, the title of the Bill shall be read by the Clerk at the Table and the Bill shall then be deemed to have been read the first time and to have been ordered to be printed and shall stand for second reading upon such day as the Minister or Parliamentary Secretary may appoint."

Section 55 says:

"Notice must be given immediately after its first reading of a second reading of a Bill if it is intended to proceed with the Bill at the next meeting, or an interval of not less than seven days must elapse between the first and second reading."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. ආර්. ජයවර්ධන මයා.]

That is clearly the procedure when a Bill is read for the first time in this House and the Bill is presented in this House. Immediately after the First Reading the Minister can say: "Second Reading tomorrow". But he cannot say: "Second Reading tomorrow" with regard to a Bill coming from the Senate. Even the sponsor of a Bill cannot say that according to Section 77 of the Standing Orders which says:

> "(not being less than five clear days after the giving of such notice.)"

So that the only notice to the Clerk, given to him at the Table, is the one sponsored by the hon. Member for Tissamaharama (Mr. Lakshman Rajapaksa) and the hon. Member for Puttalam (Mr. Naina Marikar) that the Press Bill should be taken up for Second Reading on the day named by them—the 2nd February, 1965.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

What is the point of Order the hon. Member is raising? This is not a new procedure that has been adopted in this House. Customarily, in this House, when a Bill is presented the Minister in charge says: "tomorrow" is the date of the Second Reading, but it has never been the custom to take up a Bill tomorrow. That has now become the accepted tradition in this House. That is merely a formal way of saying that the Bill will follow on the next convenient day according to the Standing Orders. That is all that it means. That is the procedure that has been followed all along. It is not a new procedure. This is not the first Bill that has been received from the Senate.

ජේ. ආර්. ජයවර්ධන මයා.
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

No.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

This is not the first time that a Bill has come from the Senate. This is the normal and customary procedure that has been adopted all this time. The hon. First Member for Colombo South (Mr. J. R. Jayewardene) knows that so far as the Press Bill is concerned the Government has already had discussions with the Leader of the Opposition and other leaders as to the number of days that are to be allotted for discussing the Bill.

ජේ. ආර්. ජයවර්ධන මයා.
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

No.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

I do not say that an agreement has been reached. All I say is that you had discussed the question.

ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (වත්තල)
*(திரு. டீ. செல்டன் ஜயசிங்ஹ—வத்தளை)*
(Mr. D. Shelton Jayasinghe—Wattala)

It has not come from the Senate still.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

The hon. Member for Wattala may not know, but surely there have been discussions. At one of these discussions I was also present. All that I am saying is that when the Bill is actually presented the question of the number of days that may be allowed for its discussion can be considered then. The question has already been asked in this House as to the number of days that are proposed to be allotted for the Second Reading of the Bill. So it does not mean that anybody has been taken by surprise.

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

We are going on the procedure that has been laid down according to the Standing Orders.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

How can we take it up tomorrow when the Standing Order states " not being less than five clear days. "

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

That has been the practice in the past with regard to every Bill that was presented in this House——

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

In this House ?

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

——as well as Bills from the Senate. We always said " tomorrow " not intending it to be the very next day.

එම්. ඩී. බණ්ඩා මයා. (හඟුරන්කෙත)
(திரு. எம். டீ. பண்டா—ஹங்குரன்கெத்த)
(Mr. M. D. Banda—Hanguranketa)

In the case of Bills originating in this House you are all right.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

In the normal way after discussion with the Opposition, a decision is arrived at as to when a Bill is to be taken up and the number of days that should be set apart for discussion and so on. That has been the practice that has been followed and that will be followed in this case also. There is nothing new in regard to this procedure.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I wish to say a few words in addition to what the Hon. Minister of Finance has said. Sir, this is what Standing Order No. 77 (2) says:

" At any time after the reading of a Message recording that a Bill has been brought from the Senate . . . "

The Message was read by the Clerk a few minutes ago and immediately after that the Chief Government Whip, the Minister of Labour and Housing, the Hon. M. P. de Zoysa Siriwardena, moved the Second Reading.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

He said " tomorrow ".

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I said " tomorrow ".

ගරු ද සොයිසා සිරිවර්ධන
(கௌரவ டி சொய்சா சிறிவர்தன)
(The Hon. de Zoysa Siriwardena)

I moved the Second Reading.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

According to Standing Order No. 77 (2) the Hon. Minister of Labour and Housing is the Member who sponsored the Bill. The hon. Member for Tissamaharama did so earlier or afterwards. but within a matter of a second or two after the Clerk read out the Message, the Hon. Minister of Labour and Housing is the Member who sponsored the Bill. Therefore, there is no question as to who the sponsor of the Bill is, the Hon. Minister of Labour and Housing having sponsored the Bill. But, Sir about the time——

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

What is it ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I do not know.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

Yes, he said "tomorrow". So what? I do not understand the objection raised. The first objection is that we are violating the Standing Orders. This should be raised at the time the Bill is moved. You cannot raise it now. You can raise the question whether it is in keeping with the Standing Orders or not at the time when the Bill is moved, not now.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr J. R. Jayewardene)

The hon. Member for Tissamaharama (Mr. Lakshman Rajapaksa) sponsored the Press Bill.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

How can he sponsor the Press Bill ?

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R Jayeward ne)

The hon. Member for Tissamaharama has sponsored the Bill and moved that it be taken up for discussion on 2nd February, 1965. This is a very serious matter. This will go to courts.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

Any more comments ?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

We are asking you to abide by the Standing Orders. The Clerk should now endorse the name of the hon. Member for Tissamaharama on the back of the Bill and record in the Minutes that the said Bill has been read a first time and ordered to be read the second time upon 2nd February, 1965. I ask you to see that the provisions of Standing Order 77 (1), (2) and (3) are carried out. This is not a matter for a discussion on technical issues. This is a matter of procedure. What the outcome of the discussion is no one knows. You have, as the custodian of our rights and privileges, to abide by the Standing Orders and not by what this Member or the other Member may tell you in his wisdom. We ask you to give us, if you disagree with us, your interpretation of Standing Orders 76 and 77. Those are the relevant Standing Orders and it is only upon a proper interpretation of these two Standing Orders that you can decide for the House the issue that has been raised.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

Just a moment, if you do not mind; may I know what they are discussing ?

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

The discussion is whether the Bill has been properly moved.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

This is not the time to raise it, with all due deference. I beg your pardon, this is not the time to raise it. The time to raise it is when the Second Reading is moved. That Motion is not before the House. Under what Standing Order are you raising that question now ?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டப்ளியு. தகநாயக்க)
(Dr. W. Dahanayake)

Standing Order 77 (2).

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

After the First Reading, the question was asked, "Second Reading when ?" He said, "Tomorrow."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

Who said ?

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

The Minister concerned.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

No, he did not say it. The Leader of the House said, "Tomorrow."

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

Order, please! Before I give a Ruling on this matter—it is somewhat serious—I would like to have a discussion with the leaders because I have been a witness to what happened in the House when the Bill was presented.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

In all seriousness I would like to know what they are raising.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

I suspend the Sitting till 4.30 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින් අ. භා. 4.55ට නැවත පවත්වන ලදී.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

I am called upon to interpret Standing Order No. 77 on an inquiry made by the hon. Member for Tissamaharama as to the date on which this Bill is to be put down for Second Reading. It was submitted by the hon. First Member for Colombo South that written notice had been handed to the Clerk signed by the hon. Members for Puttalam and Tissamaharama that they would be sponsoring the Bill and that they desire the Second Reading be put down for February 2, 1965. The notice, he stated, was under Standing Order No. 77, subsection (2). When the message from the Senate was read by the Clerk today, hon. Members are aware that the Hon. Minister of Labour immediately stated: "I move the Second Reading tomorrow".

I am informed by the Clerk that the letter from the hon. Members for Puttalam and Tissamaharama, was handed to him by his Assistant almost immediately after these words were uttered by the Hon. Minister of Labour. The question that arises is whether the words uttered by the Hon. Minister of Labour are sufficient to confer on him sponsorship of the Bill.

It has been contended that what the Hon. Minister of Labour stated was not in compliance with Standing Order No. 77, sub-section (2), in that it was not an express statement to the Clerk that he will be sponsoring the Bill and that in any case his naming of "tomorrow" as the date for Second Reading made by this notice is ineffective as five clear days have to elapse before the Second Reading can be taken up under Standing Order No. 77. It was, therefore, contended that the notice sent by the hon. Members for Puttalam and Tissamaharama must be accepted.

In my opinion, the Hon. Minister's statement, although not expressly using the word "sponsor", amounted to notice that he will be sponsoring the Bill. It is true that under Standing Order No. 77, a person sponsoring a Bill has to name a date for Second Reading not less than five clear days after the giving of such notice. The Hon. Minister of Labour has overlooked this requirement and has named tomorrow as the date for Second Reading.

Under the strict interpretation of Standing Order No. 77, the notice given by the Hon. Minister of Labour is inadequate and does not

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කථානායකතුමා]

amount to a full sponsorship of the Bill as contemplated by Standing Order No. 77. The notice that is handed to the Clerk by the hon. Members for Puttalam and Tissamaharama complies with the requirements of Standing Order No. 77.

ලක්ෂ්මන් රාජපක්ෂ මයා.

*(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)*

(Mr. Lakshman Rajapaksa)

විසින් ඉදිරිපත් කරන ලදී.

කෙටුම්පත් පණත පළමුවන වර කියවන ලදින්, 1965 පෙබරවාරි 2 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද, නියෝග කරන ලදී.

## කෙටුම්පත් පණත් පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

### BILLS PRESENTED

CONTROL OF THE ACQUISITION OF LAND BILL

"to control the acquisition of land, and to provide for matters connected therewith or incidental thereto."

පිළිගන්වන ලද්දේ ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති ගරු සී. පී. ද සිල්වා විසිනි. 1964 ඔක්තෝබර් 7 වන බදාදා දෙවන වර කියවිය යුතු යයිද, එය මුද්‍රණය කළ යුතු යයිද නියෝග කරන ලදී.

### තේ ප්‍රචාරක (සංශෝධන) කෙටුම්පත් පණත

### TEA PROPAGANDA (AMENDMENT) BILL

සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ සංශෝධන සලකා බැලීමේ නියෝගය කියවන ලදී.

ගරු ටී. බී. තෙන්නකෝන් මයා.

*(கௌரவ ரி. பி. தென்னகோன்)*

(The Hon. T. B. Tennekoon)

ගරු කථානායකතුමනි, තේ ප්‍රචාරක සංශෝධන පණත සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය විසින් තව දුරටත් සාකච්ඡා කිරීම අවශ්‍ය වී ඇති බැවින් අද එය ඉදිරිපත් කරන්නෙ නැහැ.

### සමුපකාර සමිති (සංශෝධන) කෙටුම්පත් පණත

### CO-OPERATIVE SOEIETIES (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.

අ. භා. 5.2

ගරු ටී. බී. තෙන්නකෝන්

*(கௌரவ ரி. பி. தென்னகோன்)*

(The Hon. T. B. Tennekoon)

ගරු කථානායකතුමනි, "සමුපකාර සමිති (සංශෝධන) කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය" යි මම යෝජනා කරනවා. මෙම සංශෝධන ඉදිරිපත් කර ඇත්තේ සමුපකාර සමිති පාලනය පිළිබඳව ඉතාමත් දීර්ඝ කාලයක් තිස්සේ අවශ්‍යව තිබූ කරුණු කීපයක් නීති ගත කිරීමටයි. සමුපකාර සමිති පිළිබඳ තත්ත්වය තහවුරු කර ගැනීම පිණිස බැංකුවලින් සමුපකාර දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර සාමාජිකයන්ට දෙනු ලබන ණය සථිර වශයෙන් ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් දැනට තිබෙන නීතියේ ඇති දුර්වලකම් කීපයක් මෙම සංශෝධන අනුව මග හරවා ගැනීමට පුළුවන් වෙනවා ඇති. සමුපකාර සමිතිවල සාමාජිකයන්ට දෙනු ලබන ණය හෝ අත්තිකාරම් ආපසු ගෙවීම මග හැරෙන අවස්ථාවන් එමට තිබෙනවා. මේ අවස්ථාවලින් දැනට තිබෙන නීති රීති අනුව ණය ආපසු ලබා ගැනීමට හෝ වෙනත් දඬුවමක් දීමට හෝ සාර්ථක ලෙස ක්‍රියා කිරීමට නොහැකියි. මේ ළඟදී ආරම්භ කළ, සමුපකාර ගොවි සාමාජික මහතුන්ට දෙන ණය ක්‍රමය යටතේ ලමී ණය තවත් වැඩි වී තිබෙනවා. ණය ආපසු ලබා ගැනීමට නම් දැන් තිබෙන නීතිය වෙනස් කළ යුතුයි.

සමුපකාර ගොවි සාමාජිකයෙකු ඔහුගේ වී, සහතික මිල ක්‍රමය යටතේ සමිතියට විකුණන අවස්ථාවේදී ණය මුදල් හා අත්තිකාරම් මුදල් අය කර ගැනීමට දැන් බලය නැහැ. ඒ නිසයි 2 වැනි හා 3 වැනි සංශෝධන ඉදිරිපත් කරන්නට සිදු වී ඇත්තෙ. දැන් තිබෙන නීතියේ හැටියට සාමාජිකයෙක් ණය ගත් සමිතියෙන් වෙන් වී වෙන සමිතියකට බැඳී පෙර සිටි සමිතියට ඔහුගෙන් අය කර ගත යුතු ණය මුදල් ගෙවීම අත් හරිනවා. නමුත්, ඉදිරිපත් කරනු ලබන මෙම සංශෝධන අනුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඔහු ඒ ළඟට බැඳුණු අලුත් සමිතියෙනුත් ඔහුගේ පරණ ණය අය කර ගැනීමට අවස්ථාවක් සැලසෙනවා.

දැන් තිබෙන නීතියේ හැටියට තමාගේ වී, සහතික මිල ක්‍රමය යටතේ සමිතියට විකුණන්නේ නැතිව පිට විකිණීමෙන් සමිතියට ඇති ණය ආපසු ගෙවීමට බැරිව මග හරින අවස්ථාවලදී තදින් ක්‍රියා කිරීමට පුළුවන්කමක් නැහැ. අලුත් නීතිය බල පවත්වන විට, යම් කිසි සාමාජිකයකු ගෙන් ලැබිය යුතු ණය පිළිබඳව බේරුම් නඩුවක් දැමූවායින් පසු ඒ නඩුවේ තීර ණය වනුයේ සමිතියට ඒ ණය ඒ සාමා ජිකයාගෙන් ලැබිය යුතු බව නම්, එවැනි ණය ඔහුගේ චංචල හෝ නිශ්චල හෝ දේපල අල්ලා ගැනීමෙන් හෝ විකිණී මෙන් හෝ මහේස්ත්‍රාත් උසාවියක දඩ යක් ගැසීමෙන් හෝ ඒ සාමාජිකයාට දඩු වම් පැමිණවිය හැකියි.

බේරුම් කිරීම පිළිබඳ දැන් තත්ත්වය මේකයි. කිසියම් සමිතියක සාමාජිකයන් අතර හෝ, සාමාජිකයකු හා සමිතිය හෝ කාරක සභාව අතර හෝ සේවකයන් අතර හෝ සමිතිය හා සේවකයන් අතර හෝ කිසියම් කාරණයක් පිළිබඳව විවාදයක් ඇති වුවහොත්, එය කොමසාරිස්තුමා විසින් බේරුම් කරනවා. තවද සමිතියේ වැඩ කටයුතුවලට සම්බන්ධ ණයක් හෝ වංචා කරන ලද මුදලක් කිසියම් සාමාජික යකුගෙන් හෝ සේවකයකුගෙන් හෝ සමිතියට ලැබිය යුතු නම්, ඒ සම්බන්ධ යෙන්ද බේරුම් කිරීමට ක්‍රියා කරනු ලබන් නේද කොමසාරිස්තුමා විසිනුයි. මේ දෙවන කාරණාව ඉතාමත් වැදගත්. වංචා සහ දූෂණ ඇති වූ විට අය වියයුතු මුදල් මේ කොටසටයි වැටෙන්නේ. කොමසාරිස්තුමා විසින් තීරකයකු, සමුපකාර පරීක්ෂකවර යකු හෝ අධිනීතිඥයකු හෝ පත් කරනවා නඩු අහන්නට. මේ තීරණය ගැන සතුටු නැතිනම් කොමසාරිස්තුමාට ඇපැල් ගන් නටත් පුළුවනි. කොමසාරිස්තුමා, ඇපැල් ඇසීමට උසස් නිලධාරියකු පත් කරනවා. මේ ඇපැල් තීරණය කිසියම් සිවිල් උසාවි යක ප්‍රශ්න කළ නො හැකියයි දැන් නීති යේ තිබෙනවා. අලුත් නීතිවල හේතු: 1. දැන් තිබෙන නීතියේ හැටියට තීරක මහතා දුන් තීන්දුව—සාමාන්‍යයෙන් අය විය යුතු මුදල් ප්‍රමාණය—ක්‍රියාත්මක කරන්නේ—අය කරන්නේ—සිවිල් නඩු සංවිධාන සංග්‍රහයෙහි විස්තර කර ඇති ක්‍රියා මාර්ගය පිළිපදිමිනි. මේ ඉතා දීර්ඝ වූ සහ පැටලිලි සහිතවූ නිසා මුදල් ඉක්ම නින් ලබා ගන්නට බැහැ. අලුත් නීතියෙන් එක් එක් අවස්ථාවේ හැටියට තීන්දුවලින් දෙනු ලබන මුදල් ඉක්මනින් ලබා ගැනී මට කොමසාරිස්තුමාට ක්‍රියා මාර්ග කිප යක් සැලසේ. අලුත් නීතිය සංශෝධන පණතේ 5.

2. දැන් නීතියේ හැටියට බේරුම් නඩු වල තීරණ අවසාන හැටියට ගණන් ගැනෙතත් 1962 දී දුන් ශ්‍රෙෂ්ඨාධිකරණයේ තීරණයන් නිසා, බේරුම් කරුවාගේ තීර ණය හා ඇපැල් තීරණය පිළිබඳ අවසානත් වය බිඳ දමා තිබේ. තීරණය ගැන උසාවිවල ප්‍රශ්න කළ හැකියැයි මෙහිදී දක්වන ලදී. අලුත් නීතියෙන් එය අවසාන තීරණය විය යුතුයයිද සිවිල් උසාවියක ප්‍රශ්න කිරීමට භාජන නොවිය යුතුයයිද පවසා තිබේ.

3. සංශෝධන පණතේ 6 න් හා 7 න්ද තීරකයා තීරණය කළ අයවිය යුතු මුදලක් සමිතියකට ලබාගැනීම දැනට වඩා පහසු කරයි.

මේ පණත ඉතාම දීර්ඝ කාලයකට කලිනුයි මේ ගරු සභාවේදී සම්මත කර ගන්නට තිබුණේ. අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීවරයා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) සමුපකාර අංශය භාරව සිටි ඇමතිවරයා වශයෙන් කටයුතු කරන කාලයේදී මේ පණත ඉදිරිපත් කිරීමට, කෙටුම්පත් කිරීමට නියම කර තිබුණා. කලින් කල අතපසුව ගොස් දැනට අවුරුදු පහක පමණ කාලයක් පණත සම්මත කර ගැනීම අතපසු වී ගොස් තිබුණා. කෙසේ හෝ වේවා මේ නිසා දැනට කලින් තිබුණාට වඩා සමුපකාර සමිතිවලට, විවිධ සේවා සමුපකාර සමිතිවලට මේ ආදී සමුපකාර සමිතිවලට ණය දීම ආදී කටයුතු පෙරට වඩා වැඩිවශයෙන් කරන බව අප කවුරුත් දන්නවා. එම නිසා මම මේ සභාවෙන් ඉල්ලා සිටිනවා. මේ පණත සංශෝධනය කිරීමට හා සංශෝධිත වලින් යුත් පණත, භාර ගැනීමට සියලු දෙනාගේම කැමැත්ත සහ ආධාර ලබා දෙන ලෙස.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ. එච්. මාකන්-මාකර් මයා. (මඩකල පුව දෙවන මන්ත්‍රී)
(ஜனாப் ஏ. எச். மாக்கன் மாக்கர்—மட்டக் களப்பு இரண்டாம் அங்கத்தவர்)
(Mr. A. H. Macan Markar—Second Batticaloa)

Mr. Speaker, Sir, while we welcome this Bill in order to protect the co-operative societies from defaulting members, there is the other side of the question.

අ. භා. 5.10

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

Order, please! The Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරකසභා නියෝජ්‍ය සභාපති තැන්පත් අයි. ඒ. කාදර් මයා. මූලාසනාරූඪ විය.

මාකන්-මාකර් මයා.
(ஜனாப் மாக்கன் மாக்கர்)
(Mr. Macan Markar)

Sir, I said that while we welcome this Bill which would afford protection to the co-operative societies by enabling the societies to recover debts due to them from the members, yet there are instances in which co-operative societies had defaulted in the payment of dues that they were liable to pay to members who had surrendered their produce.

I find that no provision has been made in this Bill to enable such members to recover the amounts due to them from co-operative societies.

I can cite two specific instances. One is with regard to paddy sold and delivered to the Pallachenai Multi-Purpose Co-operative Society, under the G. P. S., by one M. Ibra Lebbe of Kattankudi. On 5th October 1962 he delivered paddy to this particular co-operative society and receipts were issued to him for the paddy delivered, the total value of which is Rs. 2,000.

Then a cheque was issued to him by the co-operative society which was subsequently dishonoured, and in spite of all his endeavours, this particular cultivator, Mr. Ibra Lebbe, has not yet been able to recover the sum of Rs. 2,000 due to him from the society.

The explanation given by the society is that the manager of the co-operative society at the relevant time had embezzled the funds and that, therefore, the society is not in a position to pay this sum, and that payment will be made out of the security deposit made by the particular manager. The paddy was delivered on 5th October 1962 and payment for the paddy has not been made even by 5th October 1964; that is, two years have elapsed, and no payment has been made for the paddy delivered.

I think there should be provision made to enable co-operative societies which are supplied with produce by the members to pay them expeditiously. At present a great deal of hardship is being caused to these poor peasants. I would, therefore, request the Hon. Acting Minister to see that effective provision is made in order to enable members to recover amounts due to them from their society.

There is also another case in which a producer of tobacco from Tambankaduwa had supplied tobacco to the Eravur-Tambankaduwa co-operative society for Rs. 6,000. It was delivered about four years ago but he has not yet been paid the amount due to him. I understand that the co-operative society in question is in a bad way and it is unlikely that this producer will get his money.

I think that it is very important that there should be certain regulations or rules framed and put into operation so that the individual cultivator and peasant will be safeguarded from default by the co-operative societies.

I am in full accord with the provisions of this Bill but I would ask that, in view of what I have stated, a safeguard be provided to the members of co-operative societies who supply produce.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.14

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සමුපකාර සංශෝධන පණතේ බලතල ප්‍රමාණවත් පරිදි නැති වීම ගැන විශේෂයෙන්ම යමක් කියන්නට අදහස් කරනවා. සමුපකාර අංශයෙහි තිබෙන දූෂණ මඩින්නට මේ පණත සෑහෙන තරම් උදව් වන්නේ නැහැ. සමුපකාර සමිතියක නිලධාරීන් තෝරා පත් කරගෙන ටික කලක් ගියාට පසු ඒ නිලධාරීන් විසින් අයුතු ප්‍රයෝජන ගනු ලැබෙන අවස්ථා තිබෙනවා. එසේ පත් වූ නිලධාරීන් ඉවත් කර ගැනීමට බොහොම අමාරු බවත් පෙනී යනවා. සාමාජිකයන් උනන්දු වුණත් ඒ නිලධාරීන් අස් කර ගන්නට බැහැ. මේ අතර දූෂණ ක්‍රියා දිනෙන් දින වැඩි වෙනවා. නිලධාරීන් ඒ ඒ තනතුරුවල රැඳී සිටිය යුත්තේ අසවල් අසවල් කාල සීමාවන් තුළය යනුවෙන් ව්‍යවස්ථාවල සඳහන් වුවත්, නියමිත කාල සීමාවන් ඉක්මවාද නිලධාරීන් බලයේ සිටින බව සමහර සමුපකාර සමිති සම්බන්ධයෙන් මට කියන්නට පුළුවනි. ව්‍යවස්ථාවලට පටහැණිව නිලතලවල රැඳෙමින් සමහරුන් දූෂණ ක්‍රියා කරගෙන යනවා. ව්‍යවස්ථා කෙසේ තිබුණත් මේ විධියට අවුරුදු ගණනක්ම නිලතලවල රැඳී සිටින අය ගැන මා දන්නවා. නමුත් මෙවැනි කරුණු ගැන ක්‍රියා කිරීමට තවම නීති සකස් කර නැහැ.

සමුපකාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් දැනට අවුරුදු කීපයකට පෙර නවගමුවේ සමුපකාර සමිතියේ නිලධාරීන්ගේ වංචාවක් අල්ලා ගන්නා ලද නමුත් ඔවුන්ට විරුද්ධව නිසි පරිදි ක්‍රියා කෙළේ නැහැ. නීතියේ අඩුපාඩු තිබුණු නිසා වංචාවල යෙදුණු අයට බේරෙන්නට පුළුවන් වුණා. ඒ සමුපකාර සමිතියේ භාණ්ඩාගාරික සභාපති, ආදී නිලධාරීන් ඔවුන් සතුව තිබුණු දේපල පවුලේ වෙනත් අයට පැවරුවා. රුපියල් දෙලොස් දාහක් නැත්නම් දහතුන් දාහක් වංචා කරගෙන තිබුණත්, අර නිලධාරීන්ගේ දේපල වෙනත් අයට පැවරූ නිසා ඔවුන්ගෙන් මුදල් අය කරගන්නට බැරි වුණා. මේ වගේ වංචාවල යෙදෙන අයට ඉඩ දී බේරී යන්නට ඉඩ දිය යුතු නැහැ. මේ වගේ වංචා කරන අයට බේරී යන්නට ඉඩ දෙනවා නම් ඒ මුදල්වලට වග කියන්නේ කවුද ? නමුත් මේ නීතියෙන්වත් එවැනි අයට දඬුවම් දෙන්නට ඉඩක් නැහැ.

සමුපකාර සමිති විශාල වශයෙන් මුදල් ගනුදෙනු වන ආයතන බව අප දන්නවා. ඉතින් එවැනි ආයතනවල වැඩ ගැන හොඳ විශ්වාසයක් ඒවායේ සාමාජිකයන්ට තිබෙන්නට ඕනෑ. මැනේජර්ලා, භාණ්ඩාගාරිකලා එකතු වී මුදල් වංචා කරනවා නම් ඔවුන්ට විරුද්ධව තදින් ක්‍රියා කරන්නට පුළුවන් විය යුතුයි. සාමාජිකයන් එකතු වී මුදල් ඉල්ලන විට ඒ මුදල් දෙන්නට ඕනෑ නේද? මුදල් ඉල්ලා නඩු මඟට බසින්නට පෙර ඒ නිලධාරීන් තමන් සතු දේපල පවුලේ වෙනත් අයට ලියනවා. මේ නිසා මුදල් අය කර ගන්නට සාමාජිකයන්ට පුළුවන් වන්නේ නැහැ. නමුත් මේ තත්ත්වය නැති කිරීමට මේ පණතින් හෝ විධිවිධාන සලස්වා නැහැ. සමුපකාර සමිතිවල සමහර නිලධාරීන් රුපියල් දහස් ගණන් නොව ලක්ෂ ගණන් වංචා කර ඇති බව වැඩ බලන ගරු ඇමතිතුමා දන්නවා ඇති. නමුත් ඒ මුදල් සොයන්න යන විට ඒ නිලධාරීන් තමන් සතු දේපල පවුලේ වෙන අයට ලියනවා. එසේ කොට ඔවුන් වත්කම් නැති අය බවට පත් වෙනවා. වෙනත් විධියකින් කියතොත්, බංකොලොත් තත්ත්වයට වැටෙනවා. එවැනි අය හිරගෙට යවන්න බැහැ. එම නිසා එවැනි අයත් හිරගෙට යවන්න පුළුවන් වන අන්දමට නීති සකස් කරන්න. මෙය මූලික කරුණක් බව මතක් කරන්න කැමතියි.

සමුපකාර සමිතිවල සාමාජිකයන් හැටියට වැඩි වශයෙන් සිටින්නේ ගම්බද ගොවියන් වැනි අයයි. ඒ අය නිතරම සමුපකාර සමිතියේ කටයුතු ගැන සොයා බලන්න යන්නේ නැහැ. ඒ අහිංසක සාමාජිකයන්ගේ මුදල් කොල්ල කන අය සිටිනවා නම් ඔවුන්ට බරපතළ දඬුවම් දෙන්නට ක්‍රම යෙදිය යුතුයි. සමහර නිලධාරීන් වෙනත් අයගේ අත්සන් යොදා මුදල් ආදිය අනුමත කර ගන්නවා. මේ වගේ කරුණු කොතෙකුත් පෙනී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන]

ගොස් ඇතත්, තවම නිසි පරිදි කටයුතු යෙදී නැහැ. මේ අන්දමට අපේ රටේ සමුපකාර ව්‍යාපාරය දියුණු කරන්න බැහැ. පසුගිය කාලයේදී අවංක පිරිස් පුරුදු පුහුණු කිරීමට කටයුතු යෙදූ නමුත් දැන් එය අතහැර දමා තිබෙනවා. ඒ නිසා සමුපකාර ක්‍රමය දියුණු කරගෙන ගොස් ජනතා වගේ සංවිධාන බවට සමුපකාර ආයතන පරිවර්තනය කර ගන්න බැරි වී ඇති බව මතක් කරන්න ඕනෑ. ඒක ආරක්ෂා කිරීමට නීති රීති තමුන්නාන්සේලාගේ පනත්වල නැහැ. ඒ විධියේ නීති ගෙනෙන්න වැඩ පිළිවෙළ සළස්වන්න. ඒව නොගෙනෙන්නෙ දූෂණයට බැහැල තිබෙන නිසයි. අල්ලසට, පගාවට, හොර කමට, වංචාවට මේ ආයතන යටවී තිබෙනව. ඒ ගැන කිසිම ගණනක් නැතුව රජය කටයුතු කරගෙන යන නිසයි, මේ විධියේ දේවල් සිද්ධ වෙන්නෙ. කිසිම තැනක වරදක් අසුවුණාම ඊට අච්චුවක් දෙන්ට රජය ලැහැස්ති නැහැ. එවැනි වරදක් අසු වුණාම, වෙනත් බල වේගයක් මගින් ඒක මකන්ටයි, මග හරින්ටයි, හදන්නෙ. මොන විධියේ පනත් ගෙනාවත්, වංචා, හොරකම්, අල්ලස් ගැනීම් ආදියට නියම දඬුවම් ලබා දෙන්ට තමුන්නාන්සේලාගේ රජය ලැහැස්ති නැහැ. තත්ත්වය, ඒ විධිය නම්, සමුපකාර කොහොමද දියුණු කරන්නෙ? ඒ නිසා අවශ්‍ය නීති සම්පාදනය කළාට මදි; ඒවා හරිහැටි ක්‍රියාවේ යොදවන්නත් ඕනෑ.

පසුගිය දිනවල අපි රට රටවල ඇවිද්ද. මහජන චීනයටත්, උතුරු කොරියාවටත් අපි ගියා. ඒවායේ සමුපකාර ක්‍රමය දියුණු වෙලා ඒවා දැන් "කොමියුන්" හෙවත් මහජන සංවිධාන බවට පත් වී තිබෙනව. ඒවායේ නැහැ, හොරකම; ඒවායේ නැහැ, වංචාව; ඒවායේ නැහැ, දූෂණය. ඒ සංවිධානවලින් ගොවි ජනතාව ප්‍රයෝජන ලබනව. ඒ ගැන අපි ප්‍රශංසා කරන්ට ඕනෑ, ඒ රටේ ජනතාවට අපේ යාම අග මැතිනිය කොයිතරම් නවත්වන්ට හැදුවත් අපිට ඒවා දකින්ට පුළුවන් වුණා. ඒ ගැන ඒ රටටත්, ජනතාවටත් අපි ප්‍රශංසා කරනවා. ඒ ගමනෙන් අපේ සම්බන්ධකම් තහවුරු වුණා. මහජන චීනයටත්. උතුරු කොරියානු රජයටත් අපි ඒ සම්බන්ධයෙන් ප්‍රශංසා කරන්ට ඕනෑ. අපට ඒ රටේ නියෝජිතයන් පෙන්වා දුන්න, දියුණු වූ ගොවිපොළවල් හා සමුපකාර ආදිය කටයුතු කරගෙන යන ආකාරය. ඒවා ප්‍රදේශ පාලනය කරන්ට සකස් වී තිබෙනවා. සමුපකාර ක්‍රමයෙන් දියුණු වී අද සමූහ ගොවිපොළවල් බවට පත් වී තිබෙනව. ඒ තරම් ලස්සණට ඒවායේ කටයුතු සිදු වෙනව. එක අක්කර භාගයක් වත් අත්හැර නැහැ. ගොවිතැන් කරන්ට පුළුවන් සෑම බිමකම ගොවිතැන් කර ඒවායේ ප්‍රයෝජනය මහජනයාට ලබා දෙනව.

අපි ගිය රටවල් දෙක වන උතුරු කොරියාවේ හා මහජන චීනයේ ඒ කටයුතුවල යෙදී සිටින නිලධාරීන් හා රටේ ජන නායකයින් ඒ විධියේ වැඩ පිළිවෙළවල් සකස් කර තිබෙනව, ජනතා අවශ්‍යතා අනුව. අපි දැක්ක දෙයක් පිළිබඳව පාඩමක් දුන්නත්, එයින් ප්‍රයෝජන ගන්ට මේ රජය ලැහැස්ති නැහැ. මන්ද? දූෂණය නිසා. අපි කොයි තරම් දුරට දූෂණ කටයුතු වළක්වන්ට ඉදිරිපත් වුණත්, තමුන්නාන්සේලාගේ ප්‍රතිගාමී බලවේගයන් නිසා ඒවා මැඩ පවත්වන්ට තමුන්නාන්සේලා ලැහැස්ති නැහැ. චීනයේ සහ උතුරු කොරියාවේ මේ ක්‍රම ඉතා ලස්සණට දියුණු වී තිබෙනව. තනි පුද්ගලයාගේ සාක්කුවට ධනය ඇදී යාම නතර කර, පෞද්ගලික ගසාකෑමේ ක්‍රමය නතර කර තිබෙන නිසයි, ඒ රටවල සමුපකාර ව්‍යාපාර ඒ තරම් දියුණු වී ජනතා සංවිධාන බවට පත් වී අද ලස්සණට පාලනය කරගෙන යන්නෙ. නිකම් එහෙන් මෙහෙන් පිළියම් කරල මදි. පැලැස්තර දාල හරි යන්නෙ නැහැ. අධිරාජ්‍ය බලවේගවලට යටවී විටින් විට පිළියම් කරල හරි යන්නෙ නැහැ. ඒ බැම්වලින් කඩා මේවා දියුණු කරන්ට ඕනෑ. සමූහ ගොවිපොළවල් ක්‍රමයට නියම විධියට පදනම දමන්ට ඕනෑ. අද අපේ සමුපකාර ආයතන කොයි ආකාරයටද කටයුතු කරන්නෙ? අද සමුපකාර නිලධාරීන් කොටසත්, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කොටසත්, හරිහැටි කටයුතු කරන්නෙ නැහැ. ඒවායේ පවතින දූෂණ නැති කොට නියම අන්දමේ වැඩ පිළිවෙළක් සකස් නොකර කවදාවත් සමුපකාර ව්‍යාපාරය දියුණු කරන්ට බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ රටවලින් අපි පාඩම් ඉගෙන ගන්ට ඕනෑ. මේ රටේ ජනතාවට කරුණු පැහැදිලි ලෙස කියා දී ඒ රටවල් සමග මිත්‍රත්වය දියුණු කර ඒ හැම දෙනාගේම සහයෝගතාවත් සම්බන්ධකමත් මිත්‍රත්වයත් ලබාගෙන වැඩ කරගෙන යාම සඳහා වුවමනා කරන බැම් වැඩි කර ගන්න ඕනෑ. අගමැතිණිය නම් වීරිය කළේ එය නැති කරන්නයි. තමුන්නාන්සේලා යැව්වා. ඒ රටවල තිබෙන කරුණු පැහැදිලි විශයෙන් දැනගෙන ආපසු මේ රටට ඇවිත් ඒ ආකාරයට කිව්වම ඒ අනුව රජයේ අල්ලස් දූෂණ ක්‍රම ඉවත් කරන මාර්ග යොදා ගනිිවිය කියා ආණ්ඩුව ඒවා වහන්න හදනවා. පනත් ගෙනෙන්න ගෙනෙන්න ඒකයි සිද්ධ වෙන්නෙ.

පසුගිය මාසයේ පස් වැනිදා මේ රටින් පිටත් වී ගිය අප ආපසු මේ රටට ආවෙ පෙරේදා හැන්දෑවෙ. මාසයක් පමණ කාලයක් අප එහි ගත කළා. ඒ කාල සීමාවේදි කෘෂිකාර්මික සමුපකාර සංවිධාන, "කොමියුන්" නැමති ගොවි පොළවල් අපට දකින්න ලැබුණා. හරියාකාර වැඩ කරගෙන යාම සඳහා වුවමනා කරන ආකාරයට මුදල් හදල් පාවිච්චි කරන අන්දම අපට දකින්න පුළුවන් වුණා. ප්‍රදේශයේ දියුණුව "කොමියුන්" ආදිය මගින් ලබා ඇති අන්දම අප දැක්කා. ගොවි පොළවල් බිහි කර තිබුණු සැටිත්, කර්මාන්ත ශාලා තනාගෙන තිබුණු සැටිත් අප දුටුවා. ඒවා බොහොම සතුටුදායකයි. අන්න ඒ නිසයි මා අහන්නෙ, එසේ කරන්න තමුන්නාන්සේලා ලැස්තිද කියල. ඒ ප්‍රතිපත්තිය මොකක්ද කියල අද වනතුරු කවුරුවත් දන්නෙත් නැහැ. ගරු අගමැතිණිය කියන විධියට නැසී ගිය ඇගේ දෙමව්පියන්ටවත්, නැසී ගිය බණ්ඩාරනායක අගමැතිතුමාටත් වුවමනා කරන විධියට නොවෙයි මහජනයට වුවමනා කර තිබෙන්නෙ. සමුපකාර ක්‍රමය දියුණු කරන්නෙයි කියා අප කියන්නෙ මහජනයට වුවමනා කරන ආකාරයටයි. ඒ නිසයි මේ රටවල් සමග කිට්ටු සම්බන්ධකම් වැඩි කරන්න ඕනෑය කියන්නෙ. කපන්න කොටන්න විළක්වන්න හදන්නෙ නැතිව මේවා වඩ වඩාත් තහවුරු කර ගන්න ඕනෑය කියන්නෙ මහජනයා එසේ කරන ලෙස බලා පොරොත්තු වන නිසයි.

උතුරු කොරියාව අපේ රට වැනි රටක්, එහි ජනගහනය ලක්ෂ 120 කට වඩා නැහැ. පසුගිය අවුරුදු දහසය තුළ ඒ රට දියුණුවී තිබෙන ආකාරය ගැන අප කල්පනා කර බලන්න ඕනෑ. ඒ රට තුළ පසුගිය කෙටි කාලය ඇතුළත ලබා තිබෙන දියුණුව ලංකාවේ ජනතාවට කෙලින්ම පෙන්වා දෙන්න ඕනෑ. ඒ රටේ බිම් වැඩි දියුණු කර තිබෙන ආකාරය ගැන කල්පනා කරන්න ඕනෑ. කොමියුන් ක්‍රමයටයි ඒ ප්‍රදේශවල වැඩ කරගෙන යන්නෙ. සමුපකාර ක්‍රමය උඩ ඉඩකඩම් බෙදා දී තිබෙනවා. තමන්ගේය කියන හැඟීම වෙනුවට පොදු විශයෙන් ඒවායේ සමාජිකයින් සතු දේ හැටියටයි ඒ උදවිය ඒවායේ වැඩ කරන්නෙ. ඒ තත්ත්වයට පරිවර්තනය වෙන්න ඕනෑ. නිකම් ධනපති ක්‍රමයේ පිළියම්, පැලැස්තර දමා බැහැ. ධනපති පදනම උඩත්, අධිරාජ්‍යවාදී බලපෑම් උඩත් විටින් විට මේවා කඩන්න බැහැ. ජනතා සංවිධානවලට විරුද්ධව ඇමතිතුමා කරන්නෙ මොකක්ද? විවිධ සේවා සමුපකාර සමිති මගින් වැඩ කර ගෙන යන තැන්වලට ගිහිල්ලා ඒ කිට්ටුව ඩිපෝ ඇති කිරීමයි එතුමා කරන්නෙ. ඩිපෝ දමලා කොහොමද ජනතා සංවිධාන හරි විධියට කරගෙන යන්නෙ? එතකොට ජනතාවගේ අදහස් අනුව ප්‍රදේශයේ වැඩ කරන්න බැහැ. ගරු ඇමතිතුමා හොර ගුහාවල් හදනවා. මේ සැලැස්ම වෙනස් කරන්න ඕනෑ.

අපට පිට රටවලට යාමට අවසථාව සලසා දීම ගැන ගෞරව කරන්න ඕනෑ. අපට අඩ ගහලා, ඒ රටවල ජනතා සංවිධාන මගින් වැඩ කර ගෙන යන ආකාරය පෙන්වා දී, ඒ සංවිධාන සම්බන්ධ නොයෙක් තොරතුරුත් අපට පැහැදිලි කර දීම ගැන ඒ රටවල ප්‍රධානීන්ට අප ගෞරව කරන්න ඕනෑ. එවැනි රටවල ජනතාව සමග සම්බන්ධකම් වැඩි කර ගැනීම සඳහා මේ මිත්‍රත්වය තවතවත් වැඩි කරන්ට ඕනෑ.

මෙවැනි පනත්වලින් බොරුවට පැලැස්තර දැමීමයි සිද්ධ වෙන්නෙ. හොරකම් නැති කිරීමේ මූලික සිද්ධාන්තය ඇත්තෙ නැහැ. මේ නීති සාදන්න සාදන්න හොරකම් කරනවා. හොරකම්, වංචා, අල්ලස් දූෂණවලට දඩුවම් කිරීමේ මූලික අදහසින් නොවෙයි මේවා ඉදිරිපත් කරන්නෙ. මේවායේ හුඟක් අඩුපාඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන]

තිබෙනව. සමුපකාරය දියුණු කිරීම පදනම කර ගන්න ඕනෑ. මේවා දියුණු කරන්ට නම් ආත්මාර්ථකාමී නීතිරීති ඉවත් කිරීමේ වැඩ පිළිවෙළක් අනුගමනය කරන්න ඕනෑ. ඒ පදනම තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළේ නැහැ. ඒ මූලික සිද්ධාන්තය අනුව කටයුතු කරන තුරු තමුන්නාන්සේලා මේ කරන්නෙ බොරු. පසුගිය විවාදවලදී තමුන්නාන්සේ පිටුපසින් සිටින ඔය පාර්ලිමේන්තු ලේකම්තුමා, වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) තමා බොහොම හොඳට සමුපකාරයේ මූලිකයෙක් හැටියට කටයුතු කරනවාය කිව්ව. එතුමා තවත් හොඳ කියනවා ඇති. නමුත් කෙරුවාව බැලුවොත්, පරීක්ෂා කර බැලුවොත්, ඒවා කෙරෙන හැටි පෙනෙයි. ඒ ප්‍රදේශවල සමුපකාර සමිතිවල සාමාජිකයන්ට නියම අයිතිවාසිකම් ලැබී තිබෙනවාද කියා බැලුවොත් පෙනෙයි. එමනිසා මේවා දියුණු කරන්ට නම් අපි අර මූලික පදනම ඇති කරන්ට ඕනෑ. මේ ක්‍රමය වෙනස් කරන්ට අපිට ඒ රටවල සහයෝගය ලැබෙනව. ඒ වාගේම එයින් ඒ රටවල් හා අප අතර තිබෙන සම්බන්ධකම් හා මිත්‍රත්වය තවත් වැඩි වෙනව. අප ඒ විධියට ගමන් කරන්න ඕනෑ. අධිරාජ්‍යවාදයට යට වී, ධනවාදයට යට වී මේවා කරන්ට බැහැ. අන්න ඒ කාරණය පමණක් මා මතක් කරනව. ඒ රටවලට ගිය ගමනේදී අප හොඳින් පරීක්ෂා කර බලා හුඟක් දුරට ඒ ප්‍රතිපත්ති පිළිගත්තා. අපේ රටේත් ඒ විධියට කටයුතු කරන්ට වෑයම් කිරීමේ අධිෂ්ඨානය ඇතිවයි අප ආපසු ආවෙ. අප ගිය මේ ගමන සම්බන්ධයෙන්, ඒ රටේ ජනතාව වැඩ කරන ආකාරය යනාදිය අපට දකින්න සලස්වා දීම ගැන අප ඒ මූලික යන්ට අපේ ගෞරවය පුද කරනව. ඒ අතරම ඒ රටත් අපේ රටත් අතර තිබෙන මිත්‍ර සම්බන්ධකම් වැඩි කර ගන්න නම් මේ ක්‍රමය දියුණු කර ගැනීමට මග පාදා ගන්න වුවමනා බවත් මතක් කරනව. මීට වඩා මා යමක් කියන්නෙ නැහැ.

**කේ. එම්. පී. රාජරත්න මයා. (වැලිමඩ)**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன—வெலிமடை)*
(Mr. K. M. P. Rajaratna—Welimada)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ වැඩබලන ගරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන්ට යෙදුණු සමුපකාර සමිති සංශෝධන පනත පිළිබඳව කරුණු සවල්පයක් ඉදිරිපත් කරන්ට මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා. ඔබතුමාට මතක ඇති, වැඩබලන ගරු ඇමතිතුමා කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී කියා සිටියා, සහතික මිළ පිළිබඳව තිබෙන කෘෂි ද්‍රව්‍ය ආඥාපනත, 1961 අංක 33 දරණ ආඥාපනත අනුව ගොවීන් සමුපකාර සමිතිවලට මුදල් නොගෙවන නිසා ඒ මුදල් අය කර ගැනීම සඳහා දැඩි නීතිරීති අවශ්‍ය වී තිබෙන බව. ඒ කාරණය නිසා මෙවැනි පනතක් ඉදිරිපත් කරන බවයි එතුමා කියා සිටියෙ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැඩබලන ගරු ඇමතිතුමා ගොවීන්ගෙන් මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් එසේ කියා සිටි බව තමුන්නාන්සේට මතක ඇති. මට පුදුමයි, දඹුල්ල වැනි ඡන්ද කොට්ඨාශයකින්, වැඩිපුරම ගොවීන්ගේ ඡන්දයෙන් තේරී පත්වී සිටින මන්ත්‍රීවරයෙක් මේ සභාවේ එවැනි ප්‍රකාශනයක් කිරීම ගැන.

**ගරු ටී. බී. තෙන්නකෝන්**
*(கௌரவ ரீ. பி. தென்னகோன்)*
(The Hon. T. B. Tennekoon)

මොකක්ද ප්‍රකාශය?

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

කෘෂි ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගොවීන් සමුපකාර සමිතිවලට ණය ගෙවන්නෙ නැහැ; ඒ නිසා එය සපුරාලීම සඳහා දැඩි නීතිරීති අවශ්‍යය යන්නයි තමුන්නාන්සේ කියා සිටියෙ. මේ පණතේ 2, 3 සහ 4 වන වගන්ති අප කියවා බැලුවා. විශේෂයෙන්ම කෘෂි ද්‍රව්‍ය ආඥා පණත යටතේ, සහතික මිළ යටතේ, ගොවීන් ගන්න ණය ආපසු අය කර ගැනීම පිණිසයි මේ කෙටුම්පත් පණත ඉදිරිපත් කර තිබෙන්නෙ. මා මෙය කෙටියෙන් විස්තර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්න ඕනෑ. අපේ වැඩබලන ගරු ඇමතිතුමාට මෙහි බරපතළකම තේරෙන වාද කියා මා දන්නෙ නැහැ. මෙය විස්තර ඇතිව කියවා බලන විට, මෙය ක්‍රියාවේ යෙදෙන ආකාරය ලෙස බලන විට, පෙනෙන්නෙ මොකක්ද? මොකක්ද සිදු වෙන්නෙ? ගොවියකු සමුපකාර සමිතිය කින් සහතික මිල ආඥා පණත යටතේ ණයක් ලබා ගෙන මොන හේතුවකින් හෝ එය නියමිත කාලයට ගෙව්වේ නැත් නම්, ඒ ගොවියා හිරේ යවන්න පුළුවන්. මගේ කථාවේදී පළමුවැනි තර්කය ඉදිරි පත් කරන්නේ මේකයි. මේ රටේ ගොවි ජනතාව වෙන් කර, මේ රටේ ගොවි ජනතාව යුක්තිය නොදන්න පිරිසක් හැටියට, ණයක් ගත්තාම නොගෙවන පිරිසක් හැටියට, විශේෂයෙන්ම සහතික මිල ක්‍රමය යටතේ සමුපකාර සමිතිවලින් ණය ගත්තාම ඒවා ආපසු නොගෙවන පිරිසක් හැටියට හංවඩු ගැසීම දැන් මේ ආණ්ඩුව පුරුද්දක් කරගෙන තිබෙනවා. ගොවි පණත යටතේ අසාධාරණ බදු දමා එය නොගෙව්වොත් හිරේට යවන නීති හදා, මෙවැනි ආඥා පණත් ඉදිරිපත් කර, ගොවියන් හිරේ යවන ක්‍රමයක් ක්‍රමානු කූලව ඇති කර ගෙන යන බව පෙනෙ නවා.

මේ පාර්ලිමේන්තු වාරය ආරම්භ කළාට පසු ගොවීන් සම්බන්ධව, ගොවීන් හිරේට යැවීම සම්බන්ධව, ගොවීන් හිරේට නියම කිරීමේ බලය ලබා ගැනීම සම්බන් ධව ගෙනා තුන් වැනි පණතයි මෙය. පළමු වැනි එක, ගොවි පණත යටතේ සමහර බදු නොගෙව්වොත් එම පණතේ සමහර ඒවා යටතේ ගොවීන් හිරේට යවන්නට පුළුවන් නීතියක් ඇති කර තිබ්මයි. දෙවැනි එක කෘෂි ද්‍රව්‍ය සහතික මිල (සංශෝධන) පණතයි. එය, ඉතාමත් අසාධාරණ ලෙස, වෙනත් කිසිම ජන කොටසකට බල පාන්නෙ නැති හැටියට, වෙන ජන කොටස්වලට තිබෙන ක්‍රමය වෙනස් කර, ගොවීන්ට පමණක් විශේෂ ක්‍රමයක් ඇති කර, ගොවීන් අවිශ්වාස කර, සමුපකාර සමිතිවලට ණය නොගෙව් වා කියා ගොවීන් නිපදවන දේවල් බල හත්කාරයෙන් ලබා ගන්නට හැකි විධි යට වැඩ පිළිවෙළක් යොදා තිබෙන එකක්.

දැන් මේ විවාද කරන්නේ තුන් වැනි එක. මේ පණත යටතේ ගොවියෙක් ණයක් අරගෙන එය නොදුන්නොත්, ඒ අනුව තීරකයෙක් තීරණයක් දුන් නොත්—සමුපකාර සමිතියයි ගොවියයි අතර අර්බුදයක් ඇති වී—ඒ තීරකයාගේ තීරණය යුක්ති සහගත වුණත් අයුක්ති සහගත වුණත් එය අධිකරණයට ඉදිරි පත් කරන්න ගොවියාට බලයක් නැහැ. නමුත් තීරකයාගේ තීන්දුව අධිකරණ යට ඉදිරිපත් කර අපරාධ දණ්ඩනීති සංග්‍රහයේ 312 වැනි කොටස යටතේ ඒ ගොවියාට දඬුවම් පමුණුවන්නට ආණ්ඩු වට බලයක් තිබෙනවා. මෙහි තේරුම මොකක්ද කියා මා අහනවා. බැංකුවකින් හෝ වෙනත් ණය දෙන ස්ථානයකින් හෝ ණයක් අරගෙන එය ආපසු නො දුන්නොත් උසාවියට යන්නට වෙන ජන කොටස්වලට නම් බලය තිබෙනවා. රක්ෂණ සමාගමකින් ගත්තත් තීරණ යක් දෙන්නෙ වෙන කවුරුවත් නොවෙ යි; උසාවියකට ගිහිල්ලයි තීන්දුවක් කරන්නෙ.

නමුත් ගොවියන් නියෝජනය කරනවා යයි උදන් අනන මේ ආණ්ඩුව ඒ ගොවි යාටම පහර ගැසීම කනගාටුදායක කාරණ යක්. මෙය අපේ සම්පූර්ණ අප්‍රසාදය හා විරෝධය පළ කළ යුතු කාරණයක්. මේ කෙටුම්පත් පණතෙන් වන අසාධාරණය වැඩ බලන ඇමතිතුමාට ඔප්පු කිරීම සඳහා මම නිදර්ශනයක් පෙන්වන්නම්. ඉඩම් වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමා මෙහි සිටීම ගැන මම සන්තෝෂ වෙනවා.

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමා කෘෂිකර්ම කටයුතු භාරව කටයුතු කළ කාලයේදී, මා හිතන්නේ 1962 දී, අයවැය ලේඛන සාකච්ඡාවේ කාරක සභා අවස්ථාවේදී, මම ප්‍රශ්නයක් මතු කළා, වැලිමඩ කොට්ඨාශයේ අල වගාව පිළිබඳව. 1952 දී නැති නම් 1953දී පමණ අල වැවීම සඳහා සමුපකාර සමිති මඟින් ගොවීන්ට රුපියල් 40,000 ක් පමණ ණය දුන්නා. ඒ සඳහා දෙපාර්ත මේන්තුව බීජ අල දුන්නා. ගොවීන් ඒ බීජ අල ගෙන වගා කළා. නමුත් ඔවුන්ට අස්වැන්නක් ගන්නට ලැබුනේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

ඒ වගාව සම්පූර්ණයෙන්ම වගේ විනාශ වුණා. ඒ අවස්ථාවේදී ගොවීන්ට දුන්නේ රෝගී වූ බීජ අලයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවලින් මම ඔප්පු කර සිටියා, එදා සමුපකාර සමිතිවලින ගොවීන්ට දුන්නේ රෝගී බීජ අල බව. රෝගී බීජ අලවලින් කවදාවත් අස්වැන්නක් ලබාගන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා ගොවීන්ට විශාල පාඩුවක් වන බව අමුතුවෙන් කිය යුත්තක් නොවෙයි. මේ නිසා ගොවීන්ට ණය මුදල් ගෙවීමට අපහසු වුණා. එදා ධවල පත්‍රිකාවේ සඳහන් වී තිබුණා, ඒ ප්‍රදේශයේ ගොවීන්ට අල වගා කිරීමට දුන් ණය මුදල් අය කරගැනීමට බැරි වුණාය කියා. එදා මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කර මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටියා, ඒ කොටස ධවල පත්‍රිකාවෙන් අස් කරන්නටය කියා. ගරු ඇමතිතුමා මා ඉදිරිපත් කළ කරුණු පිළිගෙන අපට පොරොන්දු වුණා, එසේ කිරීමට. ඒ අනුව එතුමා ඒ කොටස ඉවත් කළා. ඒ ගැන මම ඒ ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එය ඒ ප්‍රදේශයේ ගොවීන්ට කළ අපහාසයක්. ඒ අපහාසය එතුමා ඒ ධවල පත්‍රිකාවෙන් ඉවත් කළා. ඒ ඇමතිතුමා ඉතා සාධාරණ විදියට කටයුතු කර එය ඉවත් කළත්, මේ කෙටුම්පත් පණත අනුව ඒ ගොවීන් හිරේට යවන්න පුළුවනි. මේ විදියේ තවත් බොහෝ සිද්ධීන් ගම්වල ඇති වෙන්න ඇති. එක තැනක නොවෙයි. අනන්ත තැන්වල සිදු වන්න ඇති. මම කියන්නෙ මේ කෙටුම්පත් පණත අනුව එවැනි සිද්ධීන්ට සම්බන්ධ ගොවීන් හිරේට යවන්න පුළුවන් බවයි.

වැඩ බලන ඇමතිතුමා ඇයි මේ වගකීම ගන්නේ ? මේ කෙටුම්පත් පණතේ ඇති එක් එක් කාරණය පිළිබඳව එතුමා කරුණු හරි හැටි සොයා බැලුවාද ? මේක සෙල්ලමක් නොවෙයි. මෙය ලක්ෂ සංඛ්‍යාත ජනකායකට බලපාන එකක්. අපේ යුතුකමක් තිබෙනවා, මෙය බලපාන්නේ කාටදැයි සොයා බලා, අසාධාරණ විදියේ අනිටු විපාකවලට අපේ රටේ ජනතාව ගොදුරු නොකිරීමට. ඒ නිසා මම වැඩ බලන ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මෙහි දෙවන හා තුන්වන වගන්ති සංශෝධනය කරන්නය කියා. ඒ වගන්ති මේ කෙටුම්පත් පණතෙන් ඉවත් කරන්න. ඒකෙන් කිසි හානියක් වන්නෙනෙ නැහැ. අප මේ ඉදිරිපත් කරන කරුණුවල ඇත්ත නැත්ත සොයා බලා ඊට පසු වැඩ බලන ඇමතිතුමාට වුවමනා නම් අළුත් කෙටුම්පත් පණතක් ඉදිරිපත් කරන්න පුළුවන්. මේ වගන්ති ඉවත් කිරීමෙන් මේ පණතට කිසිම හානියක් සිදු වන්නේ නැහැ. එයින් සිදු වන්නේ මේ පණත ගොවීන්ට බලනොපෑමයි. එවිට මේ පණත බලපාන්නේ සමුපකාර සමිතිවල හොරකම් කරන උදවියට පමණයි. මේ පණතේ ඒ අයට බලපාන කොටසක් තිබෙන නිසා අපට කෙළින්ම මේ පණතට විරුද්ධ වන්න අමාරුයි. සමුපකාර සමිති ගසා කන උදවියට—ඒවායේ හොර මැරකම් කරන උදවියට—බලපාන තරමට මේ පණතට අපේ සහයෝගය දෙන්න අපි කැමතියි. මේ පණතේ තවත් කොටසක්, විශේෂයෙන් දෙවැනි තුන්වැනි වගන්ති මේ රටේ ගොවි ජනතාවට තදින් බලපානවා. ඒ නිසා කාරක සභා අවස්ථාවේදී මේ පණතේ දෙවැනි තුන්වැනි වගන්ති ඉවත් කර ගැනීමට කැමති වන ලෙස වැඩ බලන ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. අනික් එකම වගන්තියකටවත් එයින් කිසිම හානියක් සිදු වන්නෙ නැහැ. සමුපකාර සමිතිවල සේවකයන් හෝ කළමනාකාරවරුන් හෝ සභාපතිවරුන් හෝ භාණ්ඩාගාරිකවරුන් හෝ ගසා කනව නම්, හොරකම් කරනව නම්, වංචා කරනව නම්, ඒවා නැති කර ගන්න වුවමනා නම්, අනික් වගන්තිවලින් ඒ අදහස ඉෂ්ට කර ගැනීමට සම්පූර්ණයෙන්ම ඉඩ තියෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගොවීන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සාධාරණ ක්‍රමයක් වුවමනා නම් අපට එය කියා දෙන්න පුළුවනි. වැඩ බලන ඇමතිතුමාට නිලධාරීන් දී තිබෙන්නේ වැරදි උපදෙස්. පරිපාලන වාර්තාවලින් මට ඒ බව ඔප්පු කරන්න පුළුවන්. අද ඒ වාර්තා ගෙනෙන්න බැරි වීම ගැන මම කනගාටු වෙනවා. සමුපකාර කොමසාරිස්වරයාගේ අවුරුදු ගණනක පරිපාලන වාර්තා මා ළඟ තිබේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නව. ගොවි ජන සේවා කොමසාරිස්වරයාගේ පරිපාලන වාර්තා මා කියවා තිබෙනවා. ඒ හැම වාර්තාවකම කියා තිබෙනවා, මේ රටේ ණය මුදල් ගෙන තිබෙන ගොවි ජනතාවගෙන්, ඒ මුදල් නොගෙවා සිටින අය සියයට පහක්වත් නැති බව. එය මේ රටේ ගොවීන්ට විශාල නම්බුවක් බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. සුළු ප්‍රමාණයක් නොවෙයි, මේ රටේ ජනතාවගෙන් සියයට අනූවක්ම ගොවි ජනතාව. ඒ ලක්ෂ සංඛ්‍යාත ගොවි ජනතාවගෙන්, සමුපකාර සමිතිවලින් ණය අරගෙන තිබෙන අයගෙන් ඒවා නොගෙවා සිටින අය සියයට පහකට වඩා නැහැ. එසේ නම් සියයට පහක් මේ ණය නොගෙවා සිටින නිසා අනික් අනූපහටත් බලපාන අන්දමට මේ විධියේ නීති පැනවීම සාධාරණද කියා මම වැඩ බලන ඇමතිතුමාගෙන් අහනවා. ගොවිතැන ලෙහෙසියෙන් පහසුවෙන් කරන්න පුළුවන් දෙයක් නොවන බව වැඩ බලන ඇමතිතුමා දැන ගන්න ඕනෑ. ගොවියාට ස්වාභාවික උපද්‍රවවලට මුහුණ පාන්න සිදු වන අවස්ථා බොහෝ විට ඇති වෙනවා. ඒ ස්වාභාවික උපද්‍රවයන් නිසා ගොවීන් කරන වගාවට හානියක් වෙලා මේ මුදල් ගෙවන්න බැරි වුණාම සිදු වන්නෙ මොකක්ද? තමුන්නාන්සෙල ඒ අය හිරේට යවනව නේද? [බාධා කිරීමක්] නැත්තෙ මොකද? තීරකයා තමුන්නාන්සෙ නොවෙයි. බොහෝ විට ඒ තීරකයන් තීරණ දෙන්නෙ සමුපකාර සමිතිවලට පක්ෂවයි. සෑම නඩුවක් ගැනම කියන්නට මට පුළුවන්කමක් නැහැ. ඒ තීරකයන්ට අපි චෝදනා එල්ල කරන්නෙ නැහැ. එක එක නඩුවක් සම්බන්ධ කරුණු දන්නෙ නැති නිසා ඒ තීරණ යුක්තිසහගතද නැද්ද කියන්න මට පුළුවන්කමක් නැහැ. නමුත් බොහෝවිට ඒ තීරණ සමුපකාර සමිතිවලට පක්ෂව ලැබෙන බව මා දැක තිබෙන දෙයක්. අවුරුදු පහක් ඇතුළත ලැබී තිබෙන තීරණ ගැන සොයා බැලුවොත් වැඩ බලන ඇමතිතුමාට පෙනෙයි, ඒ තීරණවලින් සියයට අනූපහක්ම සමුපකාර සමිතිවලට පක්ෂව ලැබී තිබෙන බව. එසේ තීරණ ලැබී තිබෙන්නෙ ඒ කරුණු හරියට ඔප්පු වෙලා තිබෙන නිසාය කියා තර්කයක් ඉදිරිපත් කරන්න පුළුවන්. ඒක ඒ සිළි වෙලට වන්න පුළුවන්. තීරකයා සෑම වෙලාවෙම ගන්නෙ සමුපකාර සමිතියෙ පැත්තයි. මම දොස් කියන්නෙ නැහැ. සමුපකාර සමිතිත් රැක ගන්න ඕනෑ. වංචාකාරයන් ඉන්නව නම්, හොරු ඉන්නව නම්, ගසා කන උදවිය ඉන්නව නම්, කළු කඩයට බඩු යවන අය ඉන්නව නම්, එසේ කළාට ඇති වරදක් නැහැ. එය සමුපකාර ව්‍යාපාරය දියුණු කිරීමට ගන්නා පියවරක් වශයෙන් අපි පිළිගන්නවා. එය හරියි කියා අපිත් කියනවා. නමුත් මෙම තීරකයො එවැනි හැඟීමක් ඇතුව නොවෙයි, ක්‍රියා කරන්නෙ. ඒ අය අහිංසක ගොවීන් වෙනුවෙන් වෙනසක් කරන්නෙ නැහැ. ඒ අය සිතන්නෙ අහිංසක ගොවීනුත් වැටෙන්නෙ අර ගණයටය කියායි.

ගරු ඇමතිතුමා කොතරම් ඔලුව වැනුවත්, "එහෙම කරන්නෙ නැහැ" කියා කොතරම් කිව්වත් සිදු වන්නෙ වෙන දෙයක්. ගරු ඇමතිතුමා නොවෙයි මෙම නීති ක්‍රියාවෙ යොදවන්නෙ, වෙනත් නිලධාරීන් පිරිසක් විසිනුයි. අද සිටින නිලධාරීන්ට මේ රටේ ගොවීන් ගැන කිසි අනුකම්පාවක් නැහැ. ඔවුන් විඳින කරදර ගැන, මහන්සි ගැන, කිසි හැඟීමක් ඔවුන්ට නැහැ. ගොවීන් කෙරෙහි කිසිම ආදරයක් ඔවුන් තුළ නැහැ. ගොවීන් පහත් පන්තියෙ කොටසක් හැටියට පිළිගන්න නිලධාරි පැලැන්තියකුයි අද සිටින්නෙ. අද එම නිලධාරි පැලැන්තියෙ වෙනසක් ඇති වෙලා නැහැ. මෙම කාරණය වැඩ බලන ගරු ඇමතිතුමත් පිළිගන්නවා ඇති. තීරකයො පත් කරන්නෙ අර නිලධාරි පැලැන්තියෙන්මයි. එසේ කළ විට ඔවුන් ගන්නෙ වෙනත් අදහසක්ය කියා තමුන්නාන්සෙත් පිළිගන්නවා ඇති. එසේ වූ විට සිදු වන්නෙ කුමක්ද? ගොවීන් වෙනුවෙන් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් මෙම සභාවට ඇවිත් කෙටුපත් පණතක් ඉදිරිපත් කර එමගින් ගොවීන්ගේ මාරයා හැටියට ක්‍රියා කරන බවයි, මෙයින් පෙනෙන්නෙ. ඒ බව තමුන්නාන්සෙ විශෙෂයෙන් මතක තබා ගත යුතුයි. එවැනි ඉරණමකට පත් වන්න එපා කියා මා තමුන්නාන්සෙට කියනවා.

මා පෙන්වා දුන් වගන්ති දෙක ඉවත් කිරීම නිසා සමුපකාර ව්‍යාපාරයෙ හොරු අල්ලන්න කිසි අමාරුවක් වන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

මෙම වගන්ති දෙක ඉවත් කරන්න. තමුන්නාන්සෙ ගොවීන්ගෙ සංවිධාන වලින් මේ ගැන කරුණු අහන්න. තව තවත් කරුණු සොයා බලන්න. මෙම අංශය භාර ස්ථිර ඇමතිතුමා පැමිණියාට පසු මේ ප්‍රශ්නය එතුමගෙන් ඉල්ලා ගෙන එතුමගෙ පාර්ලිමේන්තු ලේකම්තුමා හැටියට කරුණු සොයා බලන්න. එසේ කරුණු සොයා බැලුවාට පසු අප කියන දේ වැරදියි කියා සිතෙනව නම් කෙටුම්පත් පණත නැවත මෙම සභාවට ඉදිරිපත් කරන්න. එතකොට අපි නිශ්ශබ්ද වෙන්නම්. මිනිත්තු පහෙන් එය සම්මත කර ගන්න ඉඩ දෙන්නම්. මේ සම්බන්ධයෙන් මා ඉතා දීර්ඝ ලෙසත් පැහැදිලි ලෙසත් කරුණු ඉදිරිපත් කරන්නෙ මෙම පියවර ඉතා භයානක පියවරක් නිසයි. මේකට අහුවෙන්න එපා, මේ පියවර ගන්න එපා. ගොවීන්ට කෙළින්ම බලපාන කරුණු දෙක ඉවත් කරන්න. සමුපකාරය ගසා කන්නන් සම්බන්ධයෙන් ක්‍රියා කරන්න අනිකුත් කරුණු ඉතිරිකර ගන්න.

ගසා කන්නන් සම්බන්ධයෙන් සකස් කර ඇති නීති රීති ඇත්ත වශයෙන්ම බලවත් මදියි කියා ප්‍රකාශ කරන්න පුළුවනි. ඒ සඳහා මීටත් වඩා දරුණු නීති රීති ගෙනාවත් අපි විරුද්ධ වන්නෙ නැහැ. නමුත් කවදාවත් ගොවීන් සමුපකාර ව්‍යාපාරය ගසා කන්නෙ නැහැ. සමුපකාර ව්‍යාපාරය ගසා කන ගුල්ලො වශයෙන් හැඳින්විය හැක්කෙ වෙන කොටසක්. එම ගුල්ලන්ට විරුද්ධව මීට වඩා බලවත් ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් ගෙනාවත් අපි විරුද්ධ වන්නෙ නැහැ. අපි ඊට සහයෝගය දෙනව. මිනිත්තු පහනේ එවැනි දේවල් සම්මත කර ගන්න අපි උදව් දෙනව. නමුත් මේ අරගෙන තියෙන වැඩ පිළිවෙල හරි මදි. අද තියෙන වැඩ පිළිවෙළට වඩා මෙම කෙටුම්පත් පණතින් ඉදිරිපත් කර තියෙන වැඩ පිළිවෙළ හොඳයි. නමුත් සම්පූර්ණ නැහැ. එහි අඩුපාඩු තියෙනව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තවත් කරුණක් මතක් කරන්න තියෙනව. හැම ආණ්ඩුවකම හැම ඇමතිවරයකුටම අමතක වන කාරණයක් තියෙනව. එනම් සමුපකාර සේවකයන් ගැනයි. මේ රටේ ඉතාම අහිංසක සේවකයන් පිරිසක් සිටිනව නම් ඒ සමුපකාර සේවකයන්ය කියන්න පුළුවනි. ඔවුන් ගත කරන්නෙ වහල් ජීවිතයක්. ලංකාවෙ කිසිම නීතියක් බල පාන්නෙ නැති කොටසක් හැටියට සලකා එවැනි සේවකයන් අස් කරන්න පුළුවනි. කම්කරු ආඥා අණපණත් මේ රටේ තියෙනව. නමුත් සමුපකාර සේවකයන්ට ඒව බලපාන්නෙ නැහැ. බලපාන හැටියට වැඩ කරන්නෙ නැහැ. සමුපකාර ව්‍යාපාරයෙන් තර වෙන්නෙ සමුපකාර කළමනාකරුවන් සහ පරිපාලකවරුන් බව කියන්න ඕනැ. හැබැයි, හැම දෙනාම මේ ගණයට වැටෙන්නෙ නැහැ. ඔවුන් අන්තිමේදී බිල්ලට දෙන්නෙ අහිංසක සේවකයනුයි. මාසික වැටුප් පවා නොදී එසේ අස් කළ සේවකයන් ගැන අපි දන්නව. මැනේජර් හරි, පරිපාලක තැන හරි බස් රථයක ගමන් කරන විට ඒ බස් රථයෙම සමුපකාර සේවකයෙක් ගමන් කළාය කියා සිතමු. එවැනි තැනකදී අර සේවකයා නැගිට ඔළුව පහත් කර එම සමුපකාර මැනේජර් තැනට හෝ කළමනාකරුට හෝ සීට් එක නුදුන්නොත් සේවයෙන් අස් කරනව. එසේ ආසනය නුදුන් නිසා පැය දෙක තුනකදී අස් කළ අය ගැන අපි දන්නව. මේ සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවට ඇනුම් දුන්නත් කිසිම සාධාරණයක් ඉටු වන්නෙ නැහැ. මේ බව ඔප්පු කරන්ට මට පුළුවන්. මේ කාරණය හේතුකොටගෙන සමුපකාර සමිති සේවකයො ඉතාම ලොකු භීතියකට පත් වී සිටිනවා. ඒ වාගේම ඔවුන් කල කිරීමකට පත් වී සිටිනවා. කොයි ඇමතිවරයාද ඒ සේවකයන් ගැන සිත යොමු කෙළේ ? ලක්ෂ ගණනක් සේවකයන් ඉන්නව. සමුපකාර සමිති ව්‍යාපාරය හරියාකාර ක්‍රියාත්මක වන්නට නම් ඒ අයගේ උපදෙස් ලබාගෙන පාලනය සම්බන්ධයෙන් ඒ අයත් සම්බන්ධ කර ගන්න ඕනැ. ඒ අනුවයි දූෂණ නැති කිරීමට පුළුවන් වන්නෙ. නමුත් ඒ අය පොඩි මිනිස්සු නිසා කවුරුත් ඒ ගැන සලකන්නෙ නැහැ. හැබැයි ඡන්ද කාලෙට නම් පොඩි මිනිස්සු ඕනැ වෙනව. ඡන්ද කාලෙට සමුපකාර සමිති කළමනාකාරවරු ඒ අහිංසක සේවකයන්ව නොනිසි මාර්ග වල යොදවනව. නමුත් අනික් වෙලාවලදී ඔවුන්ට සලකන්නෙ වහල් තත්ත්වයකින්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ස්වීර ඇමතිතුමා මේ අවස්ථාවේදී නොසිටීම ගැන මම කනගාටු වෙනවා. නැති කෙනකුට දොස් කීම මගේ ප්‍රතිපත්තිය නොවෙයි. මම මේ කරන්නේ දොස් කීමක් නොවෙයි; යම් කාරණාවක් පෙන්වා දීමයි. වෙළඳ ඇමතිතුමා ඇමති ධුරයේ වැඩ භාර ගත්තාට පසුව ප්‍රකාශයක් කර තිබුණා, සමුපකාර සමිති සේවකයන් සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් යොදනවාය කියා. ඇත්ත වශයෙන් ඒ ප්‍රකාශය ගැන අපි සන්තෝෂ වුණා. මා හිතන්නේ එය පළාත් පාලන සේවකයන් සම්බන්ධයෙන් යොදා ඇති පත් කිරීම්, අස් කිරීම්, උසස් කිරීම් යනාදිය පිළිබඳ වැඩ පිළිවෙළට සමාන වැඩ පිළිවෙළක් වෙන්න ඇත කියා. එවැනි ප්‍රකාශයක් කළා පමණයි, අද වන තුරු ඒ ගැන කිසිම දෙයක් කර නැහැ. ඇයි ඒවා නොකරන්නෙ? ඒව ඉතාමත් අවශ්‍ය දේවල්. මෙවැනි පණතක් සාර්ථක කර ගන්න ඕනෑ නම්, දූෂණ නැති කරන්න ඕනෑ නම්, ඒ සම්බන්ධ කෙටුම්පතක් ඉතාමත් අවශ්‍යයි. එවැනි නීති ගෙනෙන්නෙ නැතිව, ගොවියන් හිරේ යැවීම සඳහා නීති ඉදිරිපත් කිරීම ගැනයි අපි කනගාටු වෙන්නෙ. එවැනි අවශ්‍ය දේ කරන්නෙ නැතිව, අනවශ්‍ය දේ ඉදිරිපත් කරගෙන මේ රටට කෑම ටික සොයා දෙන ඒ ගොවියාට දඩුවම් පැමිණවීමට මෙසේ ඇත් ක්‍රියා කරනවා. ඒ නිසා අවසාන වශයෙන් මම කියන්න කැමතියි මෙම කෙටුම්පත් පණතේ දෙවැනි හා තුන් වැනි වගන්ති ඉවත් කරන්නේ නම් අනික් වගන්තිවලට අපේ විරුද්ධත්වයක් නැති බව. ගොවියා කෙරෙහි බල පාන ඒ වගන්ති දෙක ඉවත් කරගෙන අනික් වගන්ති සම්මත කරගෙන මෙම කෙටුම්පත් පණත ක්‍රියාත්මක කිරීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. ගොවියන්ගේ ණය ගැනීම පිළිබඳව විශෙෂයෙන් ගරු ඇමතිතුමා දැඩි පරීක්ෂණ පවත්වා— විධිමත් පරීක්ෂණ පවත්වා—කරුණු හරි හැටි අවබෝධ කරගෙන ඊට පසුව ඒ ගැන වැඩ පිළිවෙළක් යොදන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 5.58

**ඇල්බට් සිල්වා මයා.**
*(திரு. அல்பேட் சில்வா)*
(Mr. Albert Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වංචාකාරී පුද්ගලයන් මුදල් ගසා කෑම, මුදල් වංචා කිරීම, නවතා දැමීම පිණිස මෙවැනි තද නීති පැනවීම ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් මෙවැනි නීති සම්පාදනය කරන විට එහි අනික් පැත්ත ගැනත් බලන්න ඕනෑ. ඒ කියන්නෙ සමුපකාර සමිතිවලින් ගොවියන්ට ලැබෙන්න තිබෙන මුදල් ලබාදීම ගැනත් යම් කිසි වැඩ පිළිවෙළක් ඇති කළ යුතුයි. විශේෂයෙන් ඌව පැලවත්ත විවිධ සේවා සමුපකාර සමිතියේ බල ප්‍රදේශය ඇතුළත වී බුසල් එක් දහස් ගණනක් ඒ සමිතිය විසින් ගොවියන්ගෙන් ලබාගෙන තිබෙන අතර ඒ සඳහා ඒ ගොවි ජනතාවට දෙන්නට තිබෙන රුපියල් දහසය දාහක පමණ මුදල් ප්‍රමාණයත් තවමත් දී නැහැ. ඒ ගොවි ජනතාව කීපවරක්ම ගරු ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කළා. නමුත් අවුරුදු තුනක් ගත වී ඇතත් තවමත් ඒ ගොවි ජනතාවට මුදල් ලැබී නැහැ. සමිතියත් එහෙමපිටින්ම බංකොළොත් වෙලා. බංකොළොත් වුණාට පසුව පහළ ඌව විවිධ සේවා සමුපකාර සමිති සංගමය විසින් එම සමිතිය භාරගෙන දැන් ඒ සංගමය මඟින් පාලනය වෙනවා. ඒ සම්බන්ධවත් කරුණු ඉදිරිපත් කළා. කෙසේ වුවද තවමත් මුදල් ලැබුණේ නැහැ. එම නිසා මා වැඩ බලන මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, ඒ ගොවිජනතාවගෙන් ගත් වී වල මුදල් ටික ලබා දීමට කටයුතු කරන ලෙසයි.

අ. භා. 5.59

**ගරු ටී. බී. තෙන්නකෝන්**
*(கௌரவ ரீ. பி. தென்னகோன்)*
(The Hon. T. B. Tennekoon)

ගරු සභාපතිතුමනි, මේ පනත පිළිබඳව මඩකලපුවේ දෙවන මන්ත්‍රීතුමා (ඒ. එච්. මාකන්-මාකර් මයා.) ඉදිරිපත් කළ කාරණා ඉතාමත් වැදගත් ලෙස සලකන අතර ඒ අදහස් අප බොහෝ දුරට භාර ගන්නවා. එසේ භාර ගැනීමට හේතු මේවායි. බොහෝ සමිතිවල සාමාජිකයන්ට තමන් භාර දුන් ද්‍රව්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ටී. බී. තෙන්නකෝන්]

වලට ලැබිය යුතු මුදල ලබා ගන්නට බැරිව සිටින බව මා දන්නවා. බොහෝ සමිතිවලින් නිකුත් කර තිබෙන චැක්පත් අතේ තබා ගෙන මාරු කරන්නට නොහැකිව කරදර විඳින ගොවීන් සිටින බව මා දැක තිබෙනවා. එම නිසා එවැනි උදවියට තමන්ගේ අයිතිවාසිකම් ලබා ගැනීමට, තමන් සැපයූ ද්‍රව්‍යවල වටිනාකම ලබාගැනීමට, යම්කිසි ක්‍රියා මාර්ගයක් ඇති කළ යුතු හෙයින් ඒ පිළිබඳව දැනට කටයුතු කර ගෙන යන බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට කැමතියි.

කොට්ටාවේ ගරු මන්ත්‍රීවරයා (ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.) ප්‍රකාශ කළ කාරණය ගැන කියන්නට ඇත්තේ සමුපකාර වැඩ කටයුතු ගැන අප සම්පූර්ණයෙන්ම සෑහීමට පත්ව නැති බවයි. ඒ වාගේම අප සම්පූර්ණයෙන්ම සතුටට පත් වී නැහැ. අප වැයම් කරන්නේ මොන අන්දමින් හෝ සමුපකාර කටයුතු දියුණු කර මහජනතාවට වැඩි වැඩියෙන් එයින් ප්‍රයෝජන අත්කර දීමටයි. ඒ ආකාරයට සකස් කිරීමට තමයි දීර්ඝ කාලයක සිට අපේ ආණ්ඩුව ක්‍රියා කර ගෙන යන්නේ. කුඩා අවදියේ සිට සමුපකාර කටයුතු ගැන උනන්දුවෙන් කටයුතු කළ පුද්ගලයකු විශයෙන්, විශේෂයෙන්ම ණය දෙන සමිති පටන් ගන්නා කාලයේ පටන්—මෙයට අවුරුදු තිහකට පමණ පෙර කාලයේ පටන්—ඒවායේ නිරතව සිටි පුද්ගලයකු විශයෙන්, මට මේවා ගැන තරමක අවබෝධයක් තිබෙනවා. ඇත්ත විශයෙන් එසේ කටයුතු කරගෙන යන අවස්ථාවේදී කිසිම සමිතියක කොයියම් අවස්ථාවක හෝ දූෂණ ක්‍රියා සිදු වීමට ඉඩ නොදුන් බව කියන්න කැමතියි. එසේම එම සමිති නියම මාර්ගයේ ගෙන යාමට මට කරන්නට පුළුවන් හැම දෙයක්ම කළ බවත්, පුළුවන් හැම වැයමක්ම දැරූ බවත්, ඒ කාලයේ පටන්ම ඉතාමත් උනන්දුවෙන් කටයුතු කළ බවත් මේ අවස්ථාවේදී ඉතාමත් ආඩම්බරයෙන් මතක් කරන්න කැමතියි. එම නිසා සමුපකාර සමිති ඇති කිරීම පිණිසත්, ඒවා දියුණු කිරීම පිණිසත් යම්කිසි ක්‍රියා මාර්ගයක් අනුගමනය කළ හැකි නම් ඒ සඳහා මම උත්සාහවත්ත වන බව කොට්ටාවේ ගරු මන්ත්‍රීවරයාට මේ අවස්ථාවේදී කියා සිටින්නට කැමතියි.

යම් යම් මන්ත්‍රීවරුන්ට පිටරට යාම සඳහා අගමැතිනිය විරුද්ධ වුණාය කියනවා නම් මම ඒ ගැන කනගාටු වෙනවා. නමුත් එසේ ඉඩ නුදුන් බවක් නම් මම කොයි යම් විධියකින්වත් භාර ගැනීමට සූදානම් නැහැ. එසේ වුණත් නවත්වන්නට වුවමනා තමක් තිබෙනවා නම් එසේ නවත්වන්නට පුළුවන්කම තිබෙනවා. කිසිවකුට හොරෙන් කටයුතු කරන්නට අපට වුවමනා කරන්නේ නැහැ. එම නිසා මේ ගරු සභාවේ එවැනි චෝදනා ඉදිරිපත් කරනවා නම් එය කනගාටුවට කරුණක් බව මතක් කරනවා. පිටරටවලට ගොස් ඒ රටවල කාරණා බලා ගෙන මේ රටට ආපසු ඇවිත් මේ රටේ දියුණුව සඳහා තමන් දන උගත් දේවලින් ප්‍රයෝජනය ගන්නවා නම්, ඒවා පිළිබඳ අවබෝධයක් රටේ ජනතාවට ලබා දීමට උත්සාහ ගන්නවා නම්, එයින් රටේ දියුණුවට හේතුවන ක්‍රියා මාර්ගයක් ගන්නවා නම්, අප හැම විටම එවැනි දේවලට ඉතාමත් කැමැත්තෙන් සිටින බව කියන්නට සතුටුයි.

වැලිමඩ ගරු මන්ත්‍රීවරයා (කේ. එම්. පී. රාජරත්න මයා.) ප්‍රකාශ කළා, ගොවියන් නැති කිරීම පිණිස, ගොවියන් අමාරුවේ දැමීම පිණිස මේ පණතේ 2 වන සහ 3 වන වගන්ති ඉදිරිපත් කර තිබෙනවාය කියා. සමුපකාර සමිතිවල වැඩ කර තිබෙන පුද්ගලයකු විශයෙන්, සෑහෙන අවබෝධයක් ලබා තිබෙන පුද්ගලයකු විශයෙන්, මට කියන්නට පුළුවනි ණය ලබා ගෙන සිටින සියයට අනූ පහක් පමණ ගොවියන් තමන් ලබා ගන්නා ණය ආපසු ගෙවීම කිසිසේත් පැහැර හරින්නේ නැති බව. තමන්ගේ වී කොටස ලැබුණු හැටියේම ණය ගෙවන අදහසිනුයි ඒ ගොවියන් ණය ලබාගෙන වැඩ කර ගෙන යන්නේ. මන්ද? ගොවියන් බොහොම අවංකව වැඩ කරන කොටසක් නිසයි. ඒ අය ණය නොගෙවීමේ අදහසින් කවදාවත් ණය ලබා ගන්නා බවක් කොයි අන්දමකින්වත් පෙනෙන්නෙ නැහැ. නමුත් කනගාටුවට කරුණක් වී තිබෙන්නේ ඔය පිරිස අතර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කපටි පුද්ගලයන් එක් කෙනෙක් දෙන් නෙක් සිටිමයි. මේ උදවිය අවංක ගොවි යන් නොමග යවන්නට උත්සාහ දර නවා. මේ අය ගොවියන් නොවෙයි, ගොවි යන්ගේ නාමය ගාගත් පුද්ගලයන් පමණයි. මේ උදවිය ගොවියන් අතරේ කට යුතු කරන ගමන් ඒ පිරිස නොමග යවා ලබා ගත් ණය මුදල් ආපසු නොදෙන ලෙස පොළඹවනවා. කොහොමවත් මුදල් නොගෙවා බේරෙන්නට වුවමනා යයි සිතන කපටි පුද්ගලයන්ද සමුපකාර සමිතිවල ඉන්නවා. මෙවැනි පුද්ගලයින් නිසා සාධාරණ පරිදි ණය මුදල් ආපසු ගෙවන අයටත් ලොකු කරදරයක් ඇති වෙනවා. ඒ විධියේ නරක පුද්ගලයන් නිසා කලට වේලාවට ණය බේරන ගොවි යාට ණයදීමට පවා මුදල් නැති වෙනවා. ඒ වගේම ණය දෙන ආයතන ද අමාරුකම් වලට මුහුණ පානවා. මේ නීතියෙන් සාධාරණ පරිදි ණය බේරන අයට කිසිම පහරක් වදින්නේ නැහැ. නියම විධියට ණය බේරන අය මේ නීතිය නිසා බිය වන්නට වුවමනාවකුත් නැහැ. ස්වාභාවික හේතූන් නිසා අස්වැන්න පාලු වී ගිය අවස්ථාවලදී ඒ පාඩුව වින්ද ගොවීන්ට විරුද්ධව ක්‍රියා කරන්නට මේ නීතිය උපයෝගී කර ගන්නේ නැහැ. එවැනි ගොවීන්ගෙන් වහාම ණය මුදල් ආපසු ලබා ගන්නට ක්‍රියා කරන්නේ නැහැ. නමුත් ගොවීන් වශයෙන් පෙනී සිට කුලියට ගොවියන් යොදා වැඩ කරවා අස්වැන්න ලබා ගන්න උදවිය බොහෝ දෙනකු සිටින බව අප දන්නවා. ඒ වගේම සමුපකාර සමිතිවලට ණය මුදල් ආපසු නොදී අස්වැන්න පිට වෙළඳුන්ට විකුණන අයත් ඉන්නවා. මෙවැනි උදවි යට විරුද්ධව ක්‍රියා කිරීම සඳහා මේ නීතිය අත්‍යාවශ්‍යව තිබෙනවා. සමහර විට රුපියල් 10 ක පවා වත්කමක් නැති ගොවීන්ට විශ්වාසය උඩ රුපියල් තුන් හාර සියය ණයට දෙන අවස්ථා තිබෙ නවා. පිළිවෙළක් නැතිව ණය දෙන්නට ගියොත් ඒ ණය ආපසු ලබා ගැනීම අමාරුයි. දෙන ලද ණය ආපසු ලබාගෙන නැවත වතාවක් ගොවීන්ගේ යහපත සඳහා ණය දීම අවශ්‍යයි. ඒ වගේම දෙන ලද ණය ආපසු ලබාගෙන සමුප කාර සමිතිවල දියුණුවත් සලසා ගත යුතුයි. මේ කරුණු ගැන කල්පනා කොට

දැනට අවුරුදු පහක පමණ කාලයක සිට ම කැබිනට් මණ්ඩලය මෙන්ම දෙපාර්ත මේන්තු ප්‍රධානයන්ද මේ නීතිය අවශ්‍ය බව කල්පනා කළ නිසයි, මෙය මේ ගරු සභාවට ඉදිරිපත් කරන ලද්දේ.

මොනරාගල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කාරණය සාධාරණ යකයි. එයත් මඩකලපුවේ ගරු දෙවන මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කාරණයට සමානයි. එවැනි කරුණු ගැන ගරු ඇමතිතුමා පැමිණි හැටියේම වැඩ පිළිවෙළක් යොදන බව මතක් කරන් නට කැමතියි.

අ. භා. 6.7

**කාරක සභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please! Mr. Speaker will now take the Chair.

**අනතුරුව කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**ගරු ටී. බී. තෙන්නකෝන්**
*(கௌரவ ரீ. பி. தென்னகோன்)*
(The Hon. T. B. Tennekoon)

ගරු කථානායකතුමනි, වැලිමඩ ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලද පරිදි සමුපකාර සමිති යටතේ සේවය කරන උද විය ලොකු කරදරයකින් සහ විහල් භාවය කින් යුක්තව සිටින බව මාද සියයට සිය යක්ම පිළිගන්නවා. ඉතාමත්ම නරක අන්දමින් හිතුවක්කාර ලෙස සේවකයන් ගේ පත් කිරීම් හා අස් කිරීම් කරන බව මා දන්නවා. මේ නිසා දැන් පළාත් පාලන ආයතනවල කෙරෙන විධියට යම් යම් මණ්ඩල පිහිටුවා ඒ මාර්ගයෙන් සමුපකාර සමිතිවලට අවශ්‍ය සේවකයන් පත් කිරීම ටත්, ඒ සේවකයන්ගේ වැරදි තිබෙනවා නම් ඒ මණ්ඩල මගින්ම ඒවා ගැන විභාග කොට නිසි දඬුවම් දීමටත්, ඒ වගේම ඒ සේවකයන් සඳහා අර්ථසාධක අරමුදලක් ඇති කිරීමටත් වෙනත් අයිතිවාසිකම් රැක දීමටත් ක්‍රියා කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරන ගමන්ම මේ පනතට මේ ගරු සභාවේ අනුමැතිය ලැබෙ නවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සමුපකාර සමිති (සංශෝධන) කෙටුම්පත් පණත

ඊට අනුකූලව කෙටුම්පත් පනත දෙවන වර කියවන ලදි.

මතු පළ වන යෝජනාව සභාසම්මත විය:

"කෙටුම්පත් පනත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවකට පැවරිය යුතුය"—(ගරු ටී. බී. තෙන්නකෝන්.)

[කාරක සභාවේදී]

කථානායකතුමා මූලාසනාරූඪ විය.

1 වන වගන්තිය කෙටුම්පත් පනතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

CLAUSE 2.—(*Amendment of section 9 of Chapter 124.*)

කේ. එම්. පී. රාජරත්න මයා.
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

2 වෙනි වගන්තිය සම්පූර්ණයෙන්ම පනතෙන් ඉවත් කරන්න කියා මා යෝජනා කරනව, සංශෝධනයක් වශයෙන්.

ගරු ටී. බී. තෙන්නකෝන්
*(கௌரவ ரீ. பி. தென்னகோன்)*
(The Hon. T. B. Tennekoon)

ඒ වගන්තිය ඉවත් කළොත් මේ පනතෙ තේරුමක් නැතිව යනව.

කේ. එම්. පී. රාජරත්න මයා.
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

නැහැ, ඒක වැරදි අදහසක්. මේ 2 වෙනි වගන්තිය තමයි, ගොවීන්ට බලපාන්නෙ. 4 වෙනි, 5 වෙනි 6 වෙනි වගන්තිවලින් පුළුවන් සමුපකාර ගසා කන්නන්, හා හොරමැරකම් සම්බන්ධයෙන් කටයුතු කරන්න. 2 වෙනි වගන්තිය බලපාන්නෙ කෘෂි ද්‍රව්‍ය තිබෙන අයටයි. 2 වෙනි වගන්තිය, සමුපකාර මැනේජර්රුන්ට, සේවකයන්ට හෝ පරිපාලකයන්ට බලපාන්නෙ නැහැ. ඒ වගන්තිය මේකයි:

"Where a member of a registered society has not made such payment to the society or acquired such interest in the society as is referred to in sub-section (1), it shall be lawful for the society, from any sum of money due from the society to such member in respect of the purchase of any scheduled agricultural product under the Agricultural Products (Guaranteed Prices and Control of Hulling and Milling) Act......"

2 වෙනි වගන්තියෙ තිබෙන්නෙ කෘෂි ද්‍රව්‍ය ආඥපනත යටතේ ගන්නා ලද ණය පිළිබඳවයි. ඒකට කළමනාකරුවන් හෝ සභාපතිවරුන් හෝ භාණ්ඩාගාරිකලා කරන හොරකම් අඩංගු වෙන්නෙ නැහැ. 4 වෙනි 5 වෙනි හා 6 වෙනි වගන්ති අනුව පුළුවන් සමුපකාර ගුල්ලො අල්ලන්ට.

විජයබාහු විජයසිංහ මයා. (මීරිගම)
*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ—மீரிகம)*
(Mr. Wijayabahu Wijayasinha—Mirigama)

That cannot be accepted.

කේ. එම්. පී. රාජරත්න මයා.
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ඔයාට බැහැ, භාර ගන්න.

ගරු ටී. බී. තෙන්නකෝන්
*(கௌரவ ரீ. பி. தென்னகோன்)*
(The Hon. T. B. Tennekoon)

සභාපතිතුමනි, ඒ සංශෝධනය භාර ගන්න පුළුවන්කමක් නැහැ.

කේ. එම්. පී. රාජරත්න මයා.
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

බැරි නම් මට මොකද? (බාධා කිරීමක්) ගොවියාගේ ඡන්දයෙන් බලයට ඇවිත් ගොවීන්ටයි ගහන්ට හදන්නෙ.

ගරු ටී. බී. තෙන්නකෝන්
*(கௌரவ ரீ. பி. தென்னகோன்)*
(The Hon. T. B. Tennekoon)

ගොවි නාමයෙන් පෙනී සිට දූෂණවල යෙදෙන පුද්ගලයන් සම්බන්ධයෙනුයි, මේ වගන්තිය යොදා තිබෙන්නෙ.

වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

2 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

3 වන වගන්තියේ සිට 6 වන වගන්තිය තෙක් කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**Clause 7.—(*Amendment of section 60 of the principal enactment.*)**

**මාකන්-මාකර් මයා.**
*(ஜனாப் மாக்கன் மாக்கர்)*
(Mr. Macan Markar)

With regard to Clause 7, I would like to know from the Acting Minister whether the provision in Clause 7 is retrospective in its effect, i.e. whether an employee of a co-operative society who had committed a breach prior to the date of coming into effect of this particular amendment would be liable ?

**ගරු ටී. බී. තෙන්නකෝන්**
*(கௌரவ ரீ. பி. தென்னகோன்)*
(The Hon. T. B. Tennekoon)

මේ පණත සම්මත වුණු දවසේ සිට.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

There is no retrospective effect.

**මාකන්-මාකර් මයා.**
*(ஜனாப் மாக்கன் மாக்கர்)*
(Mr. Macan Markar)

I say that in this particular case it should be with retrospective effect. I would like to move an amendment so that any employee who had committed any breach prior to this date also gets caught under this Act.

I move,

"At page 6, line 15, at the end, add 'which words shall have retrospective effect as from the date of the original Act'."

**ගරු ටී. බී. තෙන්නකෝන්**
*(கௌரவ ரீ. பி. தென்னகோன்)*
(The Hon. T. B. Tennekoon)

ඒ සංශෝධනය මම පිළිගන්නවා.

එම වචන එතැනට එකතු කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

වගන්තිය, සංශෝධිතාකාරයෙන්, කෙටුම්පත් පනතෙහි කොටසක් හැටියට තිබිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

7 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, කෙටුම්පත් පනතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

8 වන වගන්තිය කෙටුම්පත් පනතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය කෙටුම්පත් පනතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදි.

කෙටුම්පත් පනත සංශෝධන සහිතව වාර්තා කරන ලදි.

**ගරු ටී. බී. තෙන්නකෝන්**
*(கௌரவ ரீ. பி. தென்னகோன்)*
(The Hon. T. B. Tennekoon)

"කෙටුම්පත් පණත, සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින් සභාසම්මත විය.

කෙටුම්පත් පණත, ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදි.

## ලංකා නාවික නීතිගත සංස්ථා කෙටුම්පත් පනත

## Ceylon Shipping Corporation Bill

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදි.

අ. භා. 6.17

**ගරු ටී. බී. තෙන්නකෝන්**
*(கௌரவ ரீ. பி. தென்னகோன்)*
(The Hon. T. B. Tennekoon)

